www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ඉතිහාසහ සහ සමාජවාදී විඥානය

## 4-7 පරිච්ඡේද

## Marxism, History & Socialist Consciousness
## Chapters 4-7

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

***හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශන ආයතනය වන මේරිං බුක්ස් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත* Marxism, History & Socialist Consciousness *(මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) නම් වූ නව ග්‍රන්ථයක් පල කර ඇත. එය දැන් අපගේ වෙබ් අඩවිය හරහා කෙලින් ම මිලදී ගත හැකි ය. එය රචනා කරන ලද්දේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්යේ පූර්වගාමියා වූ වර්කර්ස් ලීගයේ හිටපු සාමාජිකයන් වන ඇලෙක්ස් ස්ටයිනර් හා ෆ්‍රෑන්ක් බෙනර් විසින් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් කරන ලද* Objectivism or Marxism *(වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද) නම් වූ විවේචනයකට පිළිතුරු වසයෙනි.***

***අපි එම ග්‍රන්ථයේ පෙල කොටස් වසයෙන් පල කිරීම ආරම්භ කලෙමු. එහි පෙරවදන දෙසැම්බර් 10 දා පල වූ අතර 1. 2 හා 3 වන පරිච්ජේද දෙසැම්බර් 11 දා පල විය. 4 සිය 7 දක්වා පරිච්ඡේද පහත පල වේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශන ආයතනය වන කම්කරු මාවත ප්‍රකාශකයන් විසින් මෙය සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ලෙස පල කරනු ලැබ ඇත.***

### 4. අපෝහකය, තත්කාර්යවාදය සහ ජාත්‍යන්තර කමිටුවේ න්‍යායික වැඩ කටයුතු

ජාත්‍යන්තර කමිටුවේ අනෙකුත් ප්‍රමුඛ න්‍යායික ව්‍යාපෘතිය වන පසු ගිය ගිම්හානයේ ඈන් ආබර්හි පවත්වන ලද දේශන පිලිබඳව ඔබ දක්වන ප්‍රතිචාරය වනාහි කයෝර විකාර කරනයකි. යලිත් වතාවක් ඔබ දේශනයන්හි අන්තර්ගතය බැරෑරුම්ව හා වෛෂයිකව ආමන්ත්‍රනය කිරීමට බැරෑරුම් ප්‍රයත්නයක් නො දරන්නෙහි ය. ගිම්හාන පාසලේ ඉදිරිපත් කරන ලද දේශන නවයෙන් ඔබ පහක් ම නො තකා හරින්නෙහි ය. මා ඉදිරිපත් කල දේශන හතර ගතහොත් ඔබ ඉන් එකකින් වත් වාක්‍ය එකක් හෝ සම්පූර්නයෙන් උපුටා දක්වන්නේ නැත. ඔබ මගේ දේශනයන්ට එල්ල කරන ප්‍රහාර පොදුවේ ආබද්ධව ඇත්තේ විකෘතීන් හා දැඩි සදොස් සරලකරනයන්ට ය. එසේත් නැත හොත් මා ඉදිරිපත් කල ආස්ථානයන් සාකල්‍යයෙන් ම අතිසරල කිරීමට ය. නැත හොත් පරිපූර්නව ම සාවද්‍ය කරනයටය. මෙයින් ඔබ උපකල්පනය කර ගන්නේ ඔබ අමතන ශ්‍රාවකය දේශනයන්ගේ සැබෑ පාඨ කියවා නැතැ යි යන්න හෝ ඔවුන්ට එය කියවීමට සැබෑ අවශ්‍යතාවක් ඇති නො වනු ඇති යයි කියා හෝ යයි නිගමනය කිරීමට සිදු වේ.

ගිම්හාන පාසල පිලිබඳ ඔබගේ විවේචනය පහත සඳහන් ප්‍රකාශයෙන් ඇරඹෙයි:

> ජාත්‍යන්තර කමිටුව තුල අපෝහකය මල අක්ෂරයකි. ව්‍යාපාරය පසු ගිය 20 වසර තුල අපෝහක දර්ශනවාදය පිලිබඳව එක ම ලිපියක් හෝ නිෂ්පාදනය කර නැත; ඒ පිලිබඳව ගිම්හාන පාසලේ දී ද දේශනයක් කැප නො කරන ලදි. පෙර දැකිය හැකි වන පරිදි ම, අපෝහකය අතහැර දැමීමේ අර්ථය වී ඇත්තේ තත්කාර්යවාදයට එරෙහි අරගලය ද අතහැර දැමීම ය. දේශනයන් තුල තත්කාර්යවාදය පිලිබඳ එක් හෝ සඳහනක් කිරීමට තරම් වටනේ යයි නො සලකන ලදී. ජාත්‍යන්තර කමිටුවේ දෘෂ්ටි ආස්ථානයට තත්කාර්යවාදය කොතරම් නො පෙනෙන තත්වයක් එලඹ ඇත් දැයි යන්න පිලිබඳ සිත්කාවදින උදාහරනයක් වූයේ එක් දේශනයක රිචඩ් රෝර්ටි, නියෝජක පශ්චාත් නූතන-වාදියෙක් යයි සාකච්ඡාවට භාජනය කරනු ලබන අතර ප්‍රමුඛ දාර්ශනික තත්කාර්යවාදියෙකු ලෙස ඔහුගේ ක්‍රියා කලාපය මුලුමනින් ම නො තකා හරිනු ලැබීම ය. එක්තරා අවධියක දී තත්කාර්යවාදයට එරෙහි අරගලය ජාත්‍යන්තර කමිටුව තුල දැනුවත් විප්ලවවාදී නායකත්වයක් පුහුනු කිරීමේ වැදගත්ම අංශය ලෙස සලකන ලද බව සලකන කල්හි මෙය පුදුමයට කරුනකි.

තර්ක කිරීමේ කොයිතරම් වංචනික විධික්‍රමයක් ද! ඔබ ජාත්‍යන්තර කමිටුව තුල අපෝහකයේ අභාවය ද තත්කාර්යවාදයට එරෙහි අරගලය අතහැර දැමීම ද පිලිබඳ සාධකය හැටියට අප විසින් තත්කාර්යවාදියෙකු ලෙස රිචර්ඩ් රෝර්ටිගේ භූමිකාව කෙරේ යොමුවනවාට වඩා ඔහු ප්‍රමුඛ පශ්චාත් නූතනවාදියෙකු ලෙස ඉටු කරන භූමිකාව අවධානයට යොමු කිරීම ඉදිරිපත් කරන්නෙහි ය. මෙවන් නිරර්ථක කතා අරමුනු කරන්නේ කුමක් ද? ඔබ බරපතලව සිතාගෙන සිටින්නේ එම ශ්‍රාවකය තුල සිටි කවරෙකුත් ඇමරිකාවේ වඩාත් ම අනුවර්තිත දාර්ශනිකයා තත්කාර්යවාදියෙකු බව දැන සිටියේ නැතැ යි කියා ද? එසේත් නැතිනම් පශ්චාත්

නූතනවාදය ම වර්තමාන තත්කාර්යවාදී දර්ශනවාදය තුල ප්‍රමුඛ ප්‍රවනතාවයක් බව ඔවුන් නොදැන සිටි බව ද? පිටු ගනනක් ගත් මා රෝර්ටි ගැන කල සාකච්ඡාව තත්කාර්යවාදයට එරෙහි අරගලයට කේන්ද්‍රීය වූ න්‍යායික ප්‍රශ්න දෙකක් කෙරේ අවධානය යොමු කලේ ය. 1) වෛෂයික ඥානයේ ශක්‍යතාවය ද වෛෂයික සත්‍යය පිලිබඳ සංකල්පය ද රෝර්ටි විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම. සහ 2) ඉතිහාසය වනාහි පාඩම් උකහා ගත හැකි වූ වෛෂයික හා නියාම-පාලිත සන්තතියක් ය යන්න චන්ඩ ලෙස ප්‍රතික්ෂේප කිරීම. රෝර්ටි ව පරීක්ෂනය කිරීමේ ලා මම මෙසේ ප්‍රකාශ කලෙමි:

> හෙතෙම සමාජ චින්තනයේ අවුරුදු 200කට වැඩි කාලයක නිර්මිතය සාකච්ඡාවෙන් බැහැර කිරීමට යෝජනා කරයි. මෙම යෝජනාවට යටින් දිව යන්නේ චින්තනයේ වර්ධනය වනාහි තනිකර ම හිතුවක්කාර සහ ආත්මීය සන්තතියක් ය යන සංකල්පය යි. වචන, න්‍යායික සංකල්ප තාර්කික ප්‍රවර්ග සහ දාර්ශනික පද්ධතීන් වනාහී විවිධ ආත්මීය අවශ්‍යතාවයන් සඳහා *තත්කාර්යවාදීව* මවා ගනු ලැබූ හුදු වාචික නිර්මිතයන් ය. න්‍යායික චින්තනයේ වර්ධනය වනාහි විකාශනයවෙමින් පවතින්නා වූ ද, ගැඹුරු වන්නා වූ ද වඩවඩාත් සංකීර්න සහ නිශ්චිත වෙමින් පවතින්නා වූ ද ස්වභාව ධර්මය සහ සමාජය පිලිබඳ මිනිසාගේ වැටැහීම ප්‍රකාශ කරන්නක් ය යන අභ්‍යර්ථනය රෝර්ටි සම්බන්ධයෙන් ගත් කල්හි හෙගේලියානු හා මාක්සියානු මන්ත්‍ර භාෂනයකට වැඩි දෙයක් නො වේ.

බ්‍රෙනර් සහෝදරය, මෙය මාක්ස්වාදය සහ තත්කාර්යවාදය අතර සාරභූත ඝට්ටනය පිලිබඳ සංක්ෂිප්ත හා නිරවද්‍ය පැහැදිලි කිරීමක් නො වේ ද?

තත්කාර්යවාදය විග්‍රහ කිරීමට මට පැවැතියේ යයි ඔබ පවසන අසමර්ථතාව පිලිබඳව ඔබ කරන චෝදනාව හුදු කන්ඩායම්වාදීව කෙරෙන විකෘතියක් පමනක් නො ව ඔබගේ ම න්‍යායික සංකල්පයන් පිලිබඳ ප්‍රකාශනයක් ද වන හෙයින්, ඔබ විසින් පශ්චාත් නූතනවාදය පිලිබඳ ප්‍රශ්නය පිලිබඳව ගනු ලබන නො සැලකිලි සහගත ප්‍රවිෂ්ටය ද අර්ථයෙන් තොර වූවක් නො වේ. ඔබ මෙසේ ලියන්නෙහි ය:

> පශ්චාත් නූතනවාදය, මාක්ස්වාදයට එරෙහි ප්‍රමුඛ දෘෂ්ටිවාදී තර්ජනය ලෙස තත්කාර්යවාදය හා අනුභූතිවාදය පරයා ඉස්මතුව ඇතැ යි යන උපකල්පනය ම නොමග ගිය එකකි. පශ්චාත් නූතනවාදය වනාහි, හැට ගනන්වල රැඩිකලුන්ගේ පරපුර දකුනට මාරුවීම ද ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ඉහල මධ්‍යම පන්තියට බද්ධ වී ගැනීම ද සමග භාවිතයට පත් ශාස්ත්‍රාලික පන්නයකි. මෙයට විසන්දනාත්මකව තත්කාර්යවාදය සහ අනුභූතිවාදය වනාහි බටහිර ධනවාදයේ සමස්ත ඓතිහාසික වර්ධනය ම සමග බැඳී පවතිත්.... එපමනක් නො ව පශ්චාත් නූතනවාදය දැනට ම බොහෝ දුරට හායනයට පත්වෙමින් පවත්නා විලාසිතාවක් වේ. එහි ප්‍රධාන කථකයන්ගෙන් බොහෝ දෙනෙකු දැනට ම මිය ගොසිනි; නැත හොත් විශ්‍රාම ගොසිනි; ඒ අතර ක්‍රියාශීලීව සිටිනා බොහෝ දෙනෙක් ආත්මරක්ෂක ප්‍රයත්නයකට ඇදවැටී සිටිති; පශ්චාත් නූතනවාදය හෙලා දැකීම දැන් රැඩිකල් හා ලිබරල් කව තුල සුලභව දක්නට ලැබේ. අවුරුදු 20කට පෙර නම් පශ්චාත් නූතනවාදයට එරෙහි ප්‍රහාරයක් එල්ල කිරීම යම් බලපෑමක් ඇති කල හැකිව තිබුනි; අද නම් එය අස්ප කුනකට, නැත හොත් ඉතා සිඟිති අස්පයෙකුට තැලීම වැනි අභ්‍යාසයකි.

මේ වනාහි දාර්ශනික ප්‍රවනතාවයන් පරීක්ෂා කිරීම කෙරේ මතුපිට, ආවේගවාදී, නො බැරෑරුම් ප්‍රවිෂ්ටයකි. සියල්ලට ප්‍රථමයෙන් මා කොතැනක හෝ ප්‍රකාශ කරවත්, අඩු ගනනේ අඟවාවත් නැති දෙයක් නම් පශ්චාත් නූතනවාදය විසින් තත්කාර්යවාදය විස්ථාපනය කරනු ලැබ ඇතැ යි යන්න ය. නැත; එය වනාහි තත්කාර්යවාදී චින්තනයේ එක්තරා ප්‍රවර්ගයකි. සත්තකින් ම එය වනාහි සම්භාව්‍ය තත්කාර්යවාදී චින්තනය තුල විලියම් ජේම්ස්ගේ සමයේ පටන් පැවැත එන ආත්මීය විඥානවාදී, ස්වේච්චානුගත, පමනක් නො ව අහේතුකවාදී අංගයන් පවා බාර ගෙන ඒවා ආන්තික හා ප්‍රතිගාමී සමාප්තියට ගෙන යන තත්කාර්යවාදී චින්තනයේ ම එක්තරා ප්‍රභේදයකි. ඔබගේ චර්චාවේ දැක්වෙන පරිදි, පශ්චාත් නූතනවාදය වනාහි න්‍යායික චින්තනයේ අතිමූලිකව විශේෂිත වර්ගයක් යයි යෝජනා කිරීම ම තත්කාර්යවාදයට පිරිනැමෙන මුඛ්‍ය සහනයකි; ඒ වනාහි තම පශ්චාත් නූතනවාදී දරු පරපුරේ ජරා'න්ත ක්‍රියා හේතු කොට ගෙන තත්කාර්යවාදයට විඳීමට සිදුව ඇති බුද්ධිමය විලිලජ්ජාවෙන් තත්කාර්යවාදය ආරක්ෂා කර දීම සඳහා දෙනු ලබන සහනයකි.

එසේ ම පශ්චාත් නූතනවාදය "පිරිහෙමින් පවතින පන්නයක්" යයි නම් කිරීම ධනේශ්වර චින්තනයේ ප්‍රතිගාමී ස්වභාවය සහ ගැඹුරු අර්බුදය යන දෙකෙහි ම අර්ථභාරී ප්‍රකාශනයක් වන දාර්ශනික ප්‍රවනතාවයක් හැල්ලු කොට තැකීමකි. එක් බාගෙට-තැම්බුනු සංකල්පයක සිට තවෙකකට පනින සුලු ධනේශ්වර ශාස්ත්‍රාලිකයෙක්, පශ්චාත් නූතනවාදය "පන්නයක්" (විලාසිතාවක්) යයි විස්තර කිරීමට ඉඩ තිබේ; විශේෂයෙන් ම තමන් මීට පෙරාතුව දරා සිටි දාර්ශනික රස්තියාදුව පිලිබඳ ගනන්හිලව් බේරා ගැනීමකින් තොරව කිසියම් අලුත් බුද්ධිමය තවලමක පස්ස අල්ලා ගැනීමට සූදානම් වන අතරතුරේ දී එවැන්නෙක් එසේ කරනු ඇත. එහෙත් මාක්ස්වාදියෙකු නම් කිසියම් න්‍යායික ප්‍රවනතාවයක් තක්සේරු කරනු ඇත්තේ එසේ නො වේ. කිසියම් තවත් ආත්මීය-විඥානවාදී දාර්ශනික ප්‍රවනතාවයක් තමන්ව නම් කර ගන්නේ කෙසේ ද යන්න දරන්නේ ද්විතීයික වැදගත් කමකි. ප්‍රධාන ප්‍රශ්නය නම් එම ප්‍රවනතාවය දර්ශනවාදයේ ඉතිහාසය කෙරේ ඇති සම්බන්ධතාවයයි. තත්කාර්යවාදය සහ අනුභූතිවාදය "බටහිර ධනවාදයේ සකල ඉතිහාසය සමග බැඳී පවතී ය" යි ඔබ නිවැරදිව ප්‍රකාශ කරන්නෙහි ය. එහෙත් පශ්චාත් නූතනවාදය පිලිබඳව ද එය සත්‍යයක්

නො වේ ද? පශ්චාත් නූතනවාදය ඇමරිකානු තත්කාර්යවාදයෙන් ගැඹුරට උකහා ගන්නවා පමනක් නො ව වෙනත් ගැඹුරින් ම ප්‍රතිගාමී වූ දාර්ශනික ප්‍රවනතාවයන්ගෙන් ද පෝෂනය වෙයි. සමකාලීන පශ්චාත් නූතනවාදීන්ගේ ලේඛනවල, තත්කාර්යවාදී රිචර්ඩ් රෝර්ටි ද ඇතුලුව කියර්කගාර්ඩ්, ෂොපනෝවර්, නියේට්ෂේ සහ හයිඩැගර් ගේ ද ගැඹුරු සන්තාප කාරක ප්‍රතිරාවයන් ඇත්තේ නැත් ද?

## 5. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තත්කාර්යවාදයට එරෙහිව සටන් කල හැටි

"ජාත්‍යන්තර කමිටුව තුල අපෝහකය මෘතා'ක්ෂරයක් (මල'කුරක්) බවට පත්ව ඇතැ" යි ද අප තත්කාර්යවාදයට එරෙහි අරගලය අතහැර දමා ඇතැ යි ද ඔබ කියා සිටින්නෙහි ය. එම අත්හැර දැමීම අපගේ ව්‍යාපාරයේ දේශපාලන දිශානතිය තුල ප්‍රකාශයට පත්වන්නේ කවර ආකාරයකින් දැයි හරිහැටි පෙන්වා දීමට ඔබ අසමත් වී ඇත. ගත වූ වර්ෂ 20 ඇතුලත අප අපෝහක භෞතිකවාදය පිලිබඳව එක් හෝ ලිපියක් සම්පාදනය කර නැතැ යි ද ඔබ අපට කියා සිටින්නෙහි ය. තථ්‍ය කාරනයක් හැටියට මෙම ප්‍රකාශය ඇත්ත නො වේ.[4] එසේ වූයේ වී නමුත් අපෝහකය නො තකා හැරීම මෙම දීර්ඝ කාල පරිච්ඡේදය තුල දී ව්‍යාපාරයේ දේශපාලන විශ්ලේෂනයන්ට හා වැඩ කටයුතු තුල ප්‍රකාශනයක් අත්පත් කර ගත්තේ කෙසේ ද යන්න විදහා දැක්වීම කල යුතු වෙයි. කලින් නිගමනය කර ගත යුතු පරිදි අප කිසියම් විධික්‍රමයක් මත වැඩ කරමින් සිට තිබේ. ඔබ තහවුරු කරන පරිදි ජාත්‍යන්තර කමිටුව තුල අපෝහකයේ මරනය තත්කාර්යවාදයට එරෙහි අරගලය අතහැර දැමීමත් සමග එකට පවතී නම් ඉන් පෙනී යන්නේ අපගේ ව්‍යාපාරය තත්කාර්යවාදී විධික්‍රමයේ ආධිපත්‍යයට යටත් තිබී ඇති බව යි. කෙසේ වෙතත් එම අභ්‍යර්ථනය සාධනය කිරීමට ඔබ උත්සාහ දරා නැත. ඔබ ලියන සෑම ලියවිල්ලක ම ඔබ වතාවතක් සේ, ''විප්ලවවාදී සටන්කරුවෙකුට මනසේ අපෝහක පුහුනුව පියානෝ වාදකයෙකුට ඇඟිලි අභ්‍යාස මෙන් ම අවශ්‍ය ය'' යන ට්‍රොට්ස්කිගේ ප්‍රකාශය කැඳවයි. ට්‍රොට්ස්කි මෙම වචන ලියූ කල්හි අපෝහක විධික්‍රමයේ මනා පරිචය ලෝක සිද්ධීන් පිලිබඳ ඔහුගේ දීප්තිමත් විශ්ලේෂනයන් තුලින් අනුපමේය ප්‍රකාශනයක් අත්පත් කර ගත්තා වූ දේශපාලන සුධීමතෙකුගේ වැඩ කටයුතුවල පූර්න ඵලය ඒවා තුල ගැබ්ව පැවැත්තේ ය. අවාසනාවකට මෙන් ඔබ මෙම වචන පාවිච්චි කරන කල්හි නම් එය පෙනී යන්නේ ශරීරය මහන්සි කරන අභ්‍යාසයන්ගේ අවශ්‍යතාවයේ වැදගත්කම කුහක ලෙස අවධාරනය කරන ගුඩු පොලයක උදාහරනයකි.

ට්‍රොට්ස්කි අපෝහකයේ වැදගත්කම බර්න්හැම් හා ෂැට්මන්ට නිකම් ම කියා සිටියා නො වේ. බර්න්හැම්ගේ තත්කාර්යවාදය ද අපෝහක භෞතිකවාදය කෙරේ ෂැට්මන්ගේ අඥේයවාදී ආකල්පය ද සෝවියට් රාජ්‍යයේ පන්ති ස්වභාවය පිලිබඳ ඔවුන්ගේ විශ්ලේෂනය තුල සහ ඔවුන් විසින් අධිරාජ්‍යවාදී ප්‍රහාරයට විරුද්ධව සෝවියට් සංගමය ආරක්ෂා කිරීම ප්‍රතික්ෂේප කිරීම තුල ප්‍රකාශනයක් අත්පත් කර ගත් අයුරු හේ මනාව පෙන්වා දුන්නේ ය. සමාජවාදී කම්කරු පක්ෂය තුල 1939-40 අරගලයේ දී අපෝහකය පිලිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කරන ලද්දේ දේශපාලන ප්‍රශ්න මගහැරීමේ ක්‍රමයක් ලෙස නො වේ; ඒවා පැහැදිලි කිරීමට ය. ට්‍රොට්ස්කි මහාචාර්ය ජේම්ස් බර්න්හැම්ට ලියා දැන් වූ පරිදි "සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයෙහි ස්වභාවය පිලිබඳ ප්‍රශ්නය මතු කලේ මා නො ව ඔබ හෙයිනි; එසේ මතු කරමින්, එමගින්, රාජ්‍යයේ පන්ති ස්වභාවය පිලිබඳ ප්‍රශ්නය ඉස්මතු කොට එමගින් රාජ්‍යයේ පන්ති ස්වභාවය තීන්දු කිරීමට ඉවහල් වන විධික්‍රමය පිලිබඳ ප්‍රශ්නය මතු කිරීමට මට බල කලේ ද ඔබ හෙයිනි." (*මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා* , පිටුව 45.) ඔහු තවදුරටත් මෙසේ ද පැහැදිලි කලේ ය, "නිරවද්‍ය විධික්‍රමය, හුදෙක් නිරවද්‍ය නිගමනයක් අත්පත් කර ගැනීම පහසු කරනවා පමනක් නො වේ; අනුක්‍රමික දම්වැලක් තුල, සෑම අලුත් නිගමනයක් ම, පුරෝගාමී නිගමන හා අනුපිලිවෙලින් යුත් දාමයක් ලෙස බද්ධ කිරීමෙන්, කෙනෙකුගේ මතකය තුල නිගමන තහවුරු ද කරවයි. දේශපාලනික නිගමන අනුභූතිකව ගොඩනගා ගනු ලැබෙන්නේ නම්, චින්තනමය අස්ථාවරත්වය කිසියම් වාසි සලසන්නක් ප්‍රකාශයට පත් කෙරේ නම්, එවිට, දේශපාලනයෙහි මාක්ස්වාදී විධික්‍රමය, බොහෝ ආකාරයන්ගෙන්, සුලුධනේශ්වර බුද්ධිමතුන්ගේ ගතිලක්ෂනයට අනුරූප වන ධාරනාවාදය මගින් අනිවාර්යයෙන්ම විස්ථාපනය කෙරේ. සිද්ධීන්හි සෑම අලුත් නැම්මක් ම, අනුභූතිවාදී ධාරනාවාදියා විසින් අනපේක්ෂිත පරිදි, ඔහුගේ හිස මත කඩා පාත් වෙමින්, තමන් ම ඊයේ ලියූ දෙය අමතක කිරීමට ඔහුට බල කරමින්, අලුත් අදහස් ඔහුගේ හිසෙහි පහල වන්නටත් පූර්වයෙන් ම අලුත් සූත්‍ර උදෙසා දැවෙන අවශ්‍යතාවක් සම්පාදනය කරවයි." (22 වන පිටුව)

තත්කාර්යවාදී විධික්‍රමය පිලිබඳ ට්‍රොට්ස්කිගේ විවේචනයේ වලංගු බව රැකී පවතී නම්, ජාත්‍යන්තර කමිටුව පසු ගිය දශක දෙක තුල අනුගමනය කල දේශපාලන පිලිවෙතේ වැනෙන සුලු භාවයන් සහ සාවද්‍යතාවයන් විදහා දැක්වීම ඔබට අමාරු ප්‍රශ්නයක් නො වනු ඇත. එහෙත් ඔබ එවන් විශ්ලේෂනයක් ඉදිරිපත් නො කරන්නෙහි ය. මේ අනුව එලඹිය හැක්කේ නිගමනයන් දෙකකින් එකකට ය. විධික්‍රමය දේශපාලන පිලිවෙතක් සූත්‍රගත කිරීම මත සැලකිය යුතු බලපෑමක් නො කරන හෙයින් වැදගත් නැත. එසේ නැත හොත් අප අපෝහකය අතහැර තත්කාර්යවාදයට ඇද වැටී ඇතැ යි යන ඔබගේ අභ්‍යර්ථනය හරයකින් තොර වචන හරඹයකි. අප සිතන්නේ දෙවැනි අර්ථකථනය නිවැරදි ය කියා ය.[5]

ඔබගේ ගැටලුවේ මූලාශ්‍රය පවතින්නේ විධික්‍රමය සහ විප්ලවවාදී දේශපාලනය අතර සම්බන්ධය ඔබ විසින් වටහා නො ගැනීම තුල ය, ඔබට ඒ ගැන උනන්දුවක් ඇත්තේ ද නැත. අපෝහකයේ වැදගත්කම ගැන ද තත්කාර්යවාදයට එරෙහි සටන ගැන ද ප්‍රකාශ නිකුත් කිරීම එක් දෙයකි. මෙය වියුක්ත සටන් පාඨයකට වැඩි දෙයක් බවට පත් කිරීම - තත්කාර්යවාදයට විරුද්ධ අරගලය පක්ෂයේ වැඩ කටයුතුවලට සම්බන්ධ කිරීම - මීට සම්පූර්නයෙන් ම වෙනස් වේ. ඔබ කෙසේ වෙතත් ඔබගේ ලියවිල්ල තුල "හීලි විසින් ඇති කරන ලද විකෘතීන්ට එරෙහිව නෝර්ත්, නිවැරදි ලෙස අපෝහකය ආරක්ෂා කලේ ය, යයි පිලිගන්නා නමුත් ඔබගේ විවිධ ලියවිලිවල කවරක හෝ දක්නට නොමැති දෙය නම් හීලි වංචාකාරී ලෙස හෙගේලියානු වාක්‍යාංශයන් පාවිච්චි කල සැටි මවිසින් එලිදරව් කල ලියවිල්ල ඔබ සැබවින්ම අධ්‍යයනය කල බවක් හෝ එම තීරනාත්මක න්‍යායික අරගලයේ පාඩම් ඔබ විසින් උකහා ගෙන ඇතැ යි යන්න හෝ පිලිබඳ කිසි ම ඇඟවීමක් ඇත්තේ නැති බවය. මෙම අසමර්ථවීමට හේතුව ලෙස බොහෝ දුරට පැහැදිලි වන්නේ ඔබ ව්‍යාපාරය හැරපියා ගියේ ඇමරිකානු ශාඛාව විසින් හීලිගේ අවස්ථාවාදී දේශපාලනය සහ එය සමග ඔහු විසින් අපෝහක විධික්‍රමය සාවද්‍යකරනය කිරීමේ පැවති සම්බන්ධතාවය පිලිබඳව කරන ලද විවේචනය වර්ධනය කිරීමට පෙරාතුව ය යන කරුන විසිනි. ස්ටයිනර් සහෝදරය 1978 දී ඔබ ව්‍යාපාරය හැර යන විටත් ඔබ සිටියේ හීලිගේ සාරභූත වශයෙන් නව හෙගේලියානු ආයිත්තමකින් සැරසී රැඟුම් පෑ තත්කාර්යවාද විශේෂයක් වූ 'ඥානනයේ භාවිතයේ' සිර වීගෙන ය.

අපගේ ව්‍යාපාරය එකල්හි අත්පත් කර ගැනීමට ආරම්භ කර තිබුනා වූ වැදගත් න්‍යායික වර්ධනය ඔබ මුලුමනින්ම අහිමි කර ගත්තෙහි ය. 1978 නොවැම්බර් 7 දින වර්කර්ස් ලීගයේ ඉදිරි දර්ශනය සහ කර්තව්‍යයන් පිලිබඳව කෙටුම්පත් යෝජනාවක් දේශපාලන කමිටුව විසින් නිකුත් කරන ලදි. එයට පහත මාතෘකාවෙන් යුතු කොටසක් ද ඇතුලත් විය: "කාර්යධරයන් පුහුනු කිරීමේ ද තත්කාර්යවාදයට එරෙහි අරගලයේ ද පදනම ලෙස ට්‍රොට්ස්කිවාදයේ ඓතිහාසික අඛන්ඩතාවය" මෙම කොටසේ වඩාත් ම වැදගත් ඡේදය දැන් මම උපුටා දක්වන්නෙමි:

> වර්කර්ස් ලීගය කම්කරු පන්තියට ගත් හැරීම එම පන්තිය එහි ඓතිහාසික භූමිකාව සඳහා සූදානම් කිරීමේ අරගලය කැනන් විසින් සංකල්පනය කර ගනු ලැබූ ආකාර ඊනියා 'කම්කරු පන්තික දිශානතිය' පිලිබඳ ප්‍රශ්නයක් ලෙස පැවතී නැත. ප්‍රතිපක්ෂයන්ගේ එකමුතුවක් ලෙස කම්කරු පන්තියේ සහ පක්ෂයේ වර්තමාන අරගලයන් ද කම්කරු පන්තියේ ඓතිහාසික අත්දැකීම්වල සමස්ත අන්තර්ගතය සහ බොල්ෂෙවික්වාදයේ වර්ධනය ද අතර ඓතිහාසික අඛන්ඩතාවයේ හුයපට ආරක්ෂා කිරීමට කරන්නා වූ අරගලයෙන් පිටස්තරව කම්කරු පන්තිය වෙතට ගත හැකි සැබෑ හැරීමක් පැවතිය නො හැකි ය. පක්ෂයේ සාමාජිකත්වය තුල සහ කම්කරු පන්තිය තුල ම ද තත්කාර්යවාදයට විරුද්ධ අරගලය බැරෑරුම්ව ක්‍රියාත්මක කල හැක්කේ පක්ෂයේ සමස්ත වැඩ කටයුතු ම සංශෝධනවාදයට විරුද්ධ අරගලයේ ඓතිහාසික ජයග්‍රහනයන් ද හතර වන ජාත්‍යන්තරයට ලියොන් ට්‍රොට්ස්කි විසින් උරුම කර ඇති දායාදය වූ ඉමහත් දේශපාලන හා න්‍යායික ප්‍රාග්ධනය ද පදනම් කිරීමේ අරගලයේ දෘෂ්ටි ආස්ථානයෙන් ම පමනි. ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ගමන් කර ඇති දෛනික අත්දැකීම් අතර සෘජු ඓතිහාසික සම්බන්ධතාවයන් පවත්වා ගෙන යෑම සඳහා වූ අරගලයෙන් තත්කාර්යවාදයට විරුද්ධ අරගලය වෙන් කල වහාම එය (තත්කාර්යවාදයට එරෙහි අරගලය) වාග් හරඹයේ අතිශයින් ම බලහීන රූප බවට පිරිහී යනු ඇත. නැත හොත් වඩාත් නිවැරදිව කිව හොත් එය තත්කාර්යවාදයේ තවත් වර්ගයක් බවට සරලව ම පත්වෙයි.

"තත්කාර්යවාදයට විරුද්ධ අරගලය" සඳහා කරන අලංකාර ආයාචනා වෙනුවට මෙම විශ්ලේෂනය හීලි සහ ස්ලෝටර් යටතේ හිස් වැකියක් බවට පත්ව තිබුනු දෙයට දේශපාලන වසයෙන් සංයුක්ත වූ අන්තර්ගතයක් ඇතුලත් කලේ ය. මෙම ලියවිල්ල තත්කාර්යවාදීන් ට ලාක්ෂනීය වූ ආවේගවාදී සහ අනුගත භාවිතයට ප්‍රතිකූලව මාක්ස්වාදීන් පන්ති අරගලයේ දෛනික වර්ධනය සහ පක්ෂයේ ක්‍රියාකාරීත්වය දැනුවත්ව තමන්ගේ ඉතිහාසයේ ද ජාත්‍යන්තර කම්කරු පන්තියේ අරගලයේ ඉතිහාසයේ ද පෘථුල සන්තතිය තුල පිහිටුවා ලීමට වැඩ කරන ආකාරය පැහැදිලි කලේ ය. ක්ෂනික හෝ කෙටිකාලීන ප්‍රායෝගික ජයග්‍රහනයන් සොයා සිද්ධීන්ට සරලව ම ප්‍රතිචාර දක්වනවා වෙනුවට මාක්ස්වාදීන් මෙම නව වර්ධනයන් විසින් ඉස්මතු කරන ලද දේශපාලන මූලධර්ම පිලිබඳ සාරභූත ප්‍රශ්නයන් අනන්‍ය කොට ගෙන නව දේශපාලන ප්‍රපංචය විශ්ලේෂනය කිරීමේ දී පක්ෂයේ සම්පූර්න ඓතිහාසිකව ඒකරාශී කර ගත් න්‍යායික ප්‍රාග්ධනය ක්‍රියාත්මක කල යුතු ය; ධනේශ්වර සමාජයේ ජාත්‍යන්තරවාදී විප්ලවවාදී බලවේගය ලෙස කම්කරු පන්තියේ දිගුකාලීන අවශ්‍යතාවයන්ට ප්‍රකාශනයක් අත්කර දිය යුතු ය.

අවුරුදු හතරකට පසු 1982 ඔක්තෝබරයේ දී වර්කර්ස් ලීගය සහ බ්‍රිතාන්‍ය කම්කරු විප්ලවවාදී පක්ෂය අතර දේශපාලන වෙනස්කම් එලියට බැස්සේ ය. 1982 ඔක්තෝබර් 19 දින බුලටින් පත්තරයේ පල කරන ලද ලිපියක 1978 දී මුලින්ම වර්ධනය කරන ලද සංකල්පයන් වඩාත් නිශ්චිත හා තීක්ෂන ස්වරූපයකින් ඉදිරිපත් කරන ලදි:

> ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඉතිහාසය අසම්බන්ධිත සිද්ධීන් මාලාවක් ලෙස වටහා ගත නොහැකි ය. එහි න්‍යායික සංවර්ධනය එහි කේඩරය විසින් ලෝක ධනවාදයේ අර්බුදයේ අඛන්ඩ දිග හැරීම තුල ජාත්‍යන්තර කම්කරු පන්තියේ අරගලයේ වර්ධනයෙන් වියුක්ත කරගනු ලැබ ඇත. 1924 ලෙනින්ගේ මරනයෙන් පසුව මාක්ස්වාදයේ එකම

සංවර්ධනය වන ට්‍රොට්ස්කිවාදයේ දැවැන්ත පොහොසත් බව සමන්විත වන්නේ මුලු මහත් *ඓතිහාසික කාල පරිච්ඡේදයක්* පුරා පන්ති අරගලයේ සියලුම අතිමූලික අත් දැකීම් පිලිබඳව කරන ලද විශ්ලේෂනයේ අභින්න අඛන්ඩතාවය එහි අන්තර්ගත වන හෙයිනි.

මෙම ඉතිහාසයේ සමස්තය උකහා ගැනීමට සාමූහිකව යත්න නොදරන නායකත්වයක් කම්කරු පන්තිය කෙරේ තම ඓතිහාසික වගකීම් ඉටුකරලීමට නො පොහොසත් ය. ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඓතිහාසික වර්ධනය පිලිබඳ සැබෑ ඥානයකින් තොරව අපෝහක භෞතිකවාදය ගැන කරන සඳහන් කිරීම් හිස් ඒවා වනවා පමනක් නොවේ; එවන් හිස් සැඳහුම් අපෝහක භෞතික විධික්‍රමය පිලිබඳ සැබෑ විකෘතියක් ද වන්නේ ය. න්‍යායේ උල්පත පවතින්නේ චින්තනය තුල නොවේ; වෛෂයික ලෝකය තුල ය. මේ අනුව ට්‍රොට්ස්කිවාදයේ වර්ධනය ගමන් කරන්නේ අපගේ ව්‍යාපාරයේ ඓතිහාසිකව උකහා ගත් සමස්ත ඥානය මත පන්ති අරගලයේ නව අත් දැකීම් ප්‍රතිෂ්ඨාපනය කිරීමෙනි.

"මේ අනුව ඥානනය අන්තර්ගතයෙන් අන්තර්ගතය කරා ප්‍රවර්තනයව ඉදිරියට ගමන් කරයි....එය එහි පෙර පැවති අන්තර්ගතයේ සමස්ත ධාරිතයම නීර්නයේ නව අවධිය කරා ඔසවයි; එහි අපෝහක ප්‍රගමනය මගින් කිසිවක් නැති කර නො ගනී. කිසිවක් අත හැර නො දමයි. ඒ වෙනුවට අත්කරගන්නා ලද සියල්ල තමන් මත තමන්ම සංකේන්ද්‍රනය වෙමින් තමන්ව ම ආඪ්‍ය කර ගනිමින් ඉදිරියට ගෙන යයි..." හෙගල්ගේ *Science of Logic* (තර්ක විද්‍යාව) නම් කෘතියෙන් ඡේදයක් තම *Philosophical Notebooks* (දාර්ශනික සටහන් පොත්)හි දී උපුටා දක්වන ලෙනින් මෙසේ ලිවී යඃ " අපෝහකය සංක්ෂිප්තව දැක්වීමක් ලෙස මෙම උධෘතය කිසිසේත් ම වරදක් නැත." [*Collected Works;* Vol. 38 (සංගෘහිත කෘති, 38 වෙලුම, 230 පි.)] එම උධෘතය "ට්‍රොට්ස්කිවාදී න්‍යායේ අනවරත අපෝහක වර්ධනයේ සංක්ෂිප්තනයක්" ලෙස ද, කිසිසේත් නරක නැත. [David North, *Leon Trotsky and the Development of Marxism* ( ඩේවිඩ් නෝර්ත්, ලියොන් ට්‍රොට්ස්කි සහ මාක්ස්වාදයේ සංවර්ධනය; ඩිට්රොයිට්, 1985. පිටු.18-19)]

කම්කරු පන්තියේ විප්ලවවාදී නායකත්වය සඳහා අරගලය අපෝහකයට දරන්නා වූ සම්බන්ධතාවය පැහැදිලි කරන ලද තවත් එක් ඡේදයක් මම උපුටා දක්වමි. එය 1989, දෙසැම්බර් 14 දින ජෙරී හීලි මලගිය පසු මා ඔහු පිලිබඳව ලියූ විග්‍රහයේ පලවිය.

මාක්ස්වාදී ව්‍යාපාරයේ දීර්ඝ ඉතිහාසයෙහි දී, අපෝහක විධික්‍රමය තමන් දේශපාලනික පෙරදැකීමෙහි, දිසානතියෙහි හා විශ්ලේෂනයෙහි විස්ථාපනය නොකල හැකි න්‍යායික ආයුධයක් වන බව ඔප්පු කොට ඇත. කෙසේ වෙතත් අපෝහක විධික්‍රමය නිසි ලෙස ප්‍රයෝජනයට ගැනුනු කල්හි දූරදර්ශී විශ්ලේෂන හා ඵලදායී උපායාත්මක ආරම්භකත්වයන් වර්ධනය කිරීම පහසු කරවතත් එපමනකින් එය දේශපාලනික පරිහානියට එරෙහිව සදාකාලික සහතිකයක් සම්පාදනය නො කරන්නේ ය. අපෝහක භෞතිකවාදය වනාහි එය අත් පත් කර ගැනුනු පසුව එය සන්තක කරගත්වුනට පන්ති බලවේගවල ක්ෂමාවිරහිත පීඩනයට එරෙහිව ආරක්ෂාව සම්පාදනය කර දෙන කිසියම් ආකාරයක දෘෂ්ටිවාදාත්මක ජීවමක් නො වේ. අපෝහක විධික්‍රමයේ උරගල වනාහි සමාජයේ පවත්නා නිෂ්පාදන සම්බන්ධතා කෙරෙහි ද ඒවා මගින් ස්වයංසිද්ධව ජනනය කෙරෙන රූපාකාරයන්ගේ දෘෂ්‍යමානය කෙරෙහි ද විවේචනාත්මක විප්ලවීය ආකල්පයක් ගැනීම යි. එය වනාහි පන්ති අරගලයෙහි වර්ධනය විසින් ඉස්මතු කෙරෙන සෑම දේශපාලනික ප්‍රශ්නයකට ම ක්‍රියාමාර්ගයෙහි දී හා භාවිතයෙහි දී විප්ලවීය කම්කරු පන්තියේ ස්වාධීන ආකල්පය තහවුරු කිරීම පිනිස නොනවතින අරගලයක් ඉල්ලා සිටින දෘඪතර විද්‍යාවක් වෙයි. විප්ලවවාදී පක්ෂයක් 'මාක්ස්වාදී' පක්ෂයක් ලෙස පවතිනුයේ එය කම්කරු පන්තිය මත ධනේශ්වරයේ හා එහි ඒජන්තයන්ගේ රුදුරු දේශපාලනික හා න්‍යායික ආනුභාව ජයගැනුමට සටන් කරන තාක් දුරට පමනි. සෑම වැදගත් සිද්ධියකට ම මාක්ස්වාදී ප්‍රවේශයක් ඇති කර ගැනීම පිනිස ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීම් යලි අධ්‍යයනය කිරීම අවශ්‍ය වෙයි. තමන් අත්පත් කරගෙන ඇති සියලු ම න්‍යායික සම්පත් සහිතව, පන්ති අරගලයේ වෛෂයික වර්ධනය විසින් පැන නැංවෙන අලුත් ගැටලුවලට අනවරතයෙන් මුහුන දීමෙන් පමනි, මාක්ස්වාදී පක්ෂයකට තම දේශපාලනික ප්‍රාග්ධනය අලුත්වැඩියා කර ගැනුමටත් එයට එකතු කර ගැනුමටත් හැකි වනුයේ. (ඩේවිඩ් නෝර්ත්, *ජෙරී හීලි සහ හතර වන ජාත්‍යන්තරයේ ඉතිහාසය තුල ඔහුට හිමි තැන*, 1991, කම්කරු මාවත ප්‍රකාශන, පිටු, 42-43)

මෙම ඡේදයෝ සමාජවාදී සමානතා පක්ෂය විසින් ශතවර්ෂ කාලකට අධික කාලයක් තිස්සේ අත්‍යසාමාන්‍ය ස්ථිරසාර භාවයකින් පවත්වා ගෙන යන ලද්දා වූ න්‍යායික-දේශපාලන ව්‍යාපෘතියක බුද්ධිමය පදනම් ඉදිරිපත් කරති. (මෙම ව්‍යාපෘතියේ ආරම්භය 1978 ඉදිරි දර්ශන ලියවිල්ල යයි සැලකුවහොත්) කම්කරු පන්තියේ භාවිතය සමකාලීන සමාජ-ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ප්‍රපංචයන්ගේ වැදගත්කම හා ගම්‍යයන් පිලිබඳව වූ විද්‍යාත්මක අවබෝධයක් මත පදනම් කිරීමට යත්න දරන අතර ම, 20 වන ශතවර්ෂයේ ජාත්‍යන්තර පන්ති අරගලයේ සමස්ත අත්දැකීම් හා පාඩම්වල නිරන්තර හා ක්‍රමානුකූල පුනර්කරනයක් මගින් කම්කරු පන්තියේ සමාජවාදී විඥානය යලි පනගන්වා වර්ධනය කිරීමට හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සටන් වැද ඇත. 1985-1986 දී කම්කරු විප්ලවවාදී පක්ෂය සමග භේදයේ පටන් ජාත්‍යන්තර කමිටුව විසින් කරන ලද මෙම න්‍යායික වැඩ කටයුතුවල නිර්මිතය ඓතිහාසික, දේශපාලන, ආර්ථික සහ න්‍යායික විශ්ලේෂන හා අර්ථකථන මහත් සම්භාරයක් තුල වාර්තාගතවී පවතී. ඈන් ආබර්හි පවත්වන ලද ගිම්හාන පාසලේ වැඩ කටයුතු ද ඉක්බිති

පවත්වන ලද ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ රැස්වීම ද, මෙම දිග් ගැසුනු හා දුෂ්කර ව්‍යාපෘතියේ ඉහල ම ජයග්‍රහනයන් නියෝජනය කලේ ය.

න්‍යායයික පද භාවිතා කරමින් සංක්ෂිප්තව කිව හොත්, මෙම සිද්ධි දෙක ම දුවැන්ත ප්‍රති-තත්කාර්යවාදී අභ්‍යාසයෝ වෙති. ජාත්‍යන්තර කමිටුවට පෙන්නීමට තිබෙන්නේ මෙම දේශන හා වාර්තා පමනක් ම යැයි සිතුවත්, අපගේ ව්‍යාපාරය තුල "අපෝහකය මල්කුරක්" බවට පත්ව තිබේ යයි ද තත්කාර්යවාදයට එරෙහි අරගලය අප විසින් අත හැර දමා ඇතැයි ද යන ඔබගේ ප්‍රකෝපකාරී කියමන බොරු කිරීමට එය හොඳටම සෑහෙයි.[6]

## 6. වෛෂයිකවාදය යනු කුමක් ද?

ඔබගේ විවාද ලිපිවල දී ද ඔබම සමග ද, ඔබ අවංකවන්නේ නම්, අප අපෝහකය සහ තත්කාර්යවාදයට එරෙහි අරගලය අතහැර දමා ඇතැයි යන ව්‍යාජ චෝදනා මගින් ඔබ දියත් කර ඇති ප්‍රහාරය වනාහි යටි උගුලක් බව ඔබ ම පිලිගනු ඇත. සැබෑ ප්‍රයුක්තය (issue) නම් සමාජවාදය සඳහා අරගලය පිනිස, ඉතිහාසය පිලිබඳ ප්‍රගාඪ ඥානයක් - විශේෂයෙන් ම සමාජවාදී ව්‍යාපාරයේ ම ඉතිහාසය පිලිබඳව - සහ එහි සංකීර්න, පරස්පර හා අන්තර්-සම්බන්ධිත රූපාකාරයන් හරහා ලෝක ධනේශ්වර පද්ධතියේ වෛෂයික චලනය පිලිබඳව (ප්‍රගාමීව එන්න එන්නම වඩ වඩාත් නිරවද්‍ය වන්නා වූ සමූපගමනයන් මගින්) හැකිතාක් නිශ්චිත වූ ද සංයුක්ත වූ ද වැටහීමක් කම්කරු පන්තිය තුල පැවතීම අත්‍යවශ්‍ය වන්නේ ය යන ජාත්‍යන්තර කමිටුවේ අවධාරනය පිලිබඳව ඔබ එකඟවන්නේ නැති බව යි. ඔබ සාවද්‍ය ලෙස "වෛෂයිකවාදය" යි නම් කරන්නේ සමාජමය මිනිසා කොටසක් වූ වෛෂයික ලෝකයේ නියාම-පාලිත චලනය ආත්මීය චින්තනය තුල නිරවද්‍යව පිලිබිඹු කර ගැනීමට ද මෙම ඥානය හා වැටහීම විප්ලවවාදී භාවිතයේ පදනම බවට පත් කර ගැනීමට ද දරනු ලබන මාක්ස්වාදී ප්‍රයත්නයයි. "අපෝහකය" ගැන ද "තත්කාර්යවාදයට එරෙහි සටන" ගැන ද ඔබ මොන තරම් කතා කලත් ඔබ ලියන සියල්ල විදහා දක්වන්නේ මාක්ස්වාදී න්‍යාය විසින් දැනුවත් වූ භාවිතයක් සහිත කම්කරු පන්ති ව්‍යාපාරයක් වර්ධනය කිරීමේ අවශ්‍යතාවයන්ට දැක්වෙන නො තැකීම ය.

ඔබ විසින් "වෛෂයිකවාදය" යන වචනය පාවිච්චි කරනු ලබන ආකාරය සාවද්‍ය ය; එය භෞතිකවාදය සමග අති මූලික නො එකඟතාවයක් පිලිබිඹු කරයි. මාක්ස්වාදීන්ට, වෛෂයිකවාදය යනුවෙන් සලකුනු වන්නේ දැනුවත් බලවේගයන්ගේ වෛෂයික සන්තතියේ ම තීරක මූලාංගයන් වන - සමාජ පන්තීන් ද ඒ හා බද්ධ දේශපාලන ප්‍රවනතාවයන්ගේ ද - ක්‍රියාකාරිත්වය පිලිබඳ සියලු විමර්ශනය බැහැර කරමින්, සමාජ ප්‍රපංචයන් පිලිබඳ අධ්‍යයනයට ඒකපාක්ෂික හා වියුක්ත ප්‍රවිශ්ටයක් පෙන්නුම් කිරීමකි. ලෙනින් මාක්ස්වාදය සහ වෛෂයිකවාදය පිලිබඳ තම සම්භාව්‍ය අර්ථකථනයේ දී පැහැදිලි කල පරිදි:

> වෛෂයිකවාදියා දෙන ලද ඓතිහාසික සන්තතියක ආවශ්‍යකතාව පිලිබඳව කථා කරයි; භෞතිකවාදියා දෙන ලද සමාජ-ආර්ථික නිර්මිතයේ ද එය විසින් පැන නැංවෙන ප්‍රතිසතිත සම්බන්ධතාවන්ගේ ද තථ්‍ය සිත්තමක් සපයයි. දෙන ලද සංසිද්ධීන් මාලාවක අවශ්‍යතාවය නියෝජනය කිරීමේ දී වෛෂයිකවාදියා සැමවිට ම මෙම සංසිද්ධීන්ගේ ක්ෂමාලාපකයෙකු බවට පත්වීමේ අන්තරායට මුහුනපායි; භෞතිකවාදියා පන්ති ප්‍රතිසතිතතාවන් එලිදරව් කර එසේ කිරීමේ දී තමාගේ ම දෘෂ්ටි ආස්ථානය නිර්වචනය කරයි. වෛෂයිකවාදියා "අනිවාරනීය ඓතිහාසික ප්‍රවනතා" ගැන කතා කරයි; භෞතිකවාදියා දෙන ලද ආර්ථික පද්ධතිය 'මෙහෙය වන' පන්තිය, වෙනත් පන්තීන්ගේ ඒහෝ මේ ප්‍රතික්‍රියා ස්වරූපයන් පැන නංවන ආකාරය ගැන සාකච්ඡා කරයි. මේ හෙයින් එක් අතකට, භෞතිකවාදියා වෛෂයිකවාදියාට වඩා ස්ථිරසාර වේ, ඔහු තම වෛෂයිකවාදයට වඩාත් ප්‍රගාඪ සහ පරිපූර්න සාඵල්‍යයක් අත් කර දේ. ඔහු සන්තතියක ආවශ්‍යකතාවය ගැන කතා කිරීමට සීමා වන්නේ නැත, ඒ වෙනුවට ඔහු ප්‍රකාශ කරන්නේ මෙම ආවශ්‍යකත්වය නීර්නය කරන්නේ කුමන පන්තියක් විසින් ද යන්න ය. උදාහරනයක් හැටියට දැන් අප සලකා බලන කාරනයේ දී, භෞතිකවාදියා "අනිවාරනීය ඓතිහාසික ප්‍රවනතාවන්" ප්‍රකාශ කිරීමෙන් තෘප්තියට පත්වීගන්නේ නැත, එහෙත් ඔහු දෙන ලද පද්ධතියක අන්තර්ගතය නීර්නය කරන්නා වූ ද නිෂ්පාදකයන්ගේ ක්‍රියාවෙන් පමනක් මිස අන් කුමන විසඳුමක හෝ ශක්‍යතාව බැහැර කරන්නා වූ ද දෙන ලද පද්ධතියක අන්තර්ගතය නීර්නය කරන්නා වූ ද සමහර පන්තීන්ගේ පැවැත්ම පෙන්නුම් කරනු ඇත. අනෙක් අතට, භෞතිකවාදය පාක්ෂිකත්වය අන්තර්ගත කර ගනී. එය මෙසේ කිව හැකි ය, සිද්ධීන් පිලිබඳ ඕනෑ ම තක්සේරුවක දී නිශ්චිත සමාජ කන්ඩායමක දෘෂ්ටි ආස්ථානය ඍජුව හා විවෘතව පිලිගැනීම සිද්ධ කරයි. [*Collected Works* Vol. 1, සංගෘහිත කෘති. පලමු වන වෙලුම. (මොස්කව් 1972) 400-01 පිටු. මුල්කෘතියේ අවධාරනය)].

ලෙනින් "වෛෂයිකවාදය" යොදා ගන්නේ විප්ලවවාදී භාවිතයේ පදනම සමන්විත වන්නා වූ සමාජ-ආර්ථික සන්තතීන් අධ්‍යයනය කරන්නන්ට එරෙහි වූ පදයක් ලෙස නො වේ. ඒ වෙනුවට, ඔහු උත්සාහ කරන්නේ වෛෂයික ලෝකය අධ්‍යයනය කිරීම දෙන ලද ඕනෑ ම සමාජ තත්වයක් තුල පන්ති ගතිකයන් අනන්‍ය කර ගත යුතු යයි ද එම පදනමේ හැකි තාක් නිරවද්‍ය ආකාරයකට විප්ලවවාදී පක්ෂයේ දේශපාලන කර්තව්‍යයන් නිර්වචනය කල යුතු යයි ද අවධාරනය කරමින් වෛෂයික ලෝකය අධ්‍යයනයට වඩාත් ප්‍රගාඪ භෞතිකවාදී අන්තර්ගතයක් අත් කර දීමට ය. ලෙනින්ගේ දැවැන්ත න්‍යායික ප්‍රතිපදානය ප්‍රධාන වසයෙන් ම විලක්ෂනය වූයේ රුසියානු කම්කරු ව්‍යාපාරයේ ක්‍රියා මාර්ගය සහ ක්‍රියාකාරිත්වය වෛෂයික

යථාර්ථය පිලිබඳ නිරවද්‍ය හා සර්වග්‍රාහී වැටහීමක් මත පදනම් කිරීමට ඔහුට පැවැතියා වූ අප්‍රතිහත අධිෂ්ඨානය විසිනි. ඔබ "වෛෂයිකවාදය" යන පදය හරඹ කරන කල්හි කෙනෙකුට පුදුම සිතෙන්නේ ලෙනින්ගේ *The Economic Content of Narodnism.* නරොඩ්නික්වාදයේ ආර්ථික අන්තර්ගතය, *The Development of Capitalism in Russia.* රුසියාවේ ධනවාදයේ සංවර්ධනය යනාදී තීරනාත්මක කෘතීන් ද ඇතුලු වෙලුම් ගනනාවක් පුරවාලමින් රුසියාවේ කෘෂිකාර්මික ප්‍රශ්නය පිලිබඳව (මේ වනාහි තමන් සුවිශේෂ විශේෂඥතාවක් වර්ධනය කර ගත්තා වූ අංශයක් ලෙස ලෙනින් විසින් සලකන ලද්දකි).[7] කල යෝධ අධ්‍යයනයන් ඔබ විසින් කෙසේ ශ්‍රේනිගත කරනු ඇත් දැයි කියා ය.

ඔබ අපට මෙසේ කියන්නෙහි යඃ "මාක්ස්වාදී විද්‍යාව සම්ප්‍රදායානුකූලාර්ථයෙන් විද්‍යාවක් නො වේඃ එහි අරමුන වන්නේ ලෝකය වටහා ගැනීම පමනක් නො ව එය පරිවර්තනය කිරීම ද වේ." එහෙත් ස්ටයිනර් සහ බ්‍රෙනර් සහෝදරවරුනි, ලෝකය විප්ලවවාදී ලෙස එනම්, ඓතිහාසිකව ප්‍රගතිශීලී ලෙස ප්‍රතිවර්තනය කිරීම ලොව පිලිබඳ නිරවද්‍ය වටහා ගැනීමක් මත කොයිතරම් දුරට පදනම් වේ ද? ඔබ මේ ප්‍රශ්නයට දෙන උත්තරය පිලිබඳව වඩාත් හොඳින් සිතා බැලිය යුතුව ඇත. ඔබ එය "සම්ප්‍රදායික" යයි නම් කලත් "අ-සම්ප්‍රදායික ය" යි නම් කලත් මාක්ස්වාදය විද්‍යාවක් ලෙස සැලකිය හැකි වන්නේ එහි ලෝක-ප්‍රතිවර්තක-භාවිතයේ අරමුන - එනම්, ධනේශ්වර සූරා කෑම අවසන් කිරීම සහ සමාජවාදී සමාජයක් පිහිටුවීම - "බලය සඳහා අධ්‍යාසයක්" පමනක් හෝ හුදු වෙනසක් සඳහා ආශාවක් පමනක් මත හෝ නොව, සමාජ ප්‍රවර්ධනයේ නීතීන් පිලිබඳ නිවැරදි වටහා ගැනීමක් මත පදනම් වන තාක් දුරට ය." විප්ලවවාදීන් ලෝකය ප්‍රතිවර්තනය කිරීමට යොදා ගනු ලබන මාක්ස්වාදය වූ කලී සමාජය පාලනය කරන්නා වූ වෛෂයික නීතීන් පිලිබඳ අවබෝධය තුල මුල් බැස ගත්තා වූ ද ඉන් වෙන් කල නො හැකි වූ ද මාධ්‍යයකි. මෙය වනාහී උල්ලංඝනය කල හොත් දේශපාලන ව්‍යසනය ද, මා ඊට තවත් එකතු කල යුතු වූ කරුනක් වන, සදාචාරාත්මක විනාශය ද ගෙන එන්නා වූ තීරක කොන්දේසියකි.

ඔබ අතිශයින් උද්ධච්ච වියුක්ත ආකාරයකට තත්කාර්යවාදයට එරෙහිව අරගලයක අවශ්‍යතාව ගැන ලියන්නෙහි ය; එහෙත් එ කී තත්කාර්යවාදය විසින්, මානව භාවිතාවේ ප්‍රතිවර්තක ධාරිතාවන් ආන්තික ලෙස උත්කර්ෂනය කිරීම මගින්, අපෝහක භෞතිකවාදය අවධාරනය කරන්නා වූ වෛෂයික ලෝකය සහ ආත්මීය විඥානය තුල එහි ප්‍රතිබිම්බනයේ රූපාකාරයන් අතර සාරභූත සත්භාවවේදාත්මක වෙනස, අහෝසි කර දැමීමට උත්සාහ කලා වූ විවිධාකාර ප්‍රවනතාවන් ගනානවක් ම 20 ශතවර්ෂය තුල දී ජනනය කරන ලද බව ඔබ මුලුමනින් ම නො දන්නා සේ ය. මිනිසා ජීවත් වන්නා වූ ලෝකය වනාහි මානව ක්‍රියාකාරීත්වය බලපවත්නා වූ ද, එ මගින් වෙනස් කරනු ලබන්නා වූ ද ලෝකයක් ය යන කරුන පිලිගැනීම තුලින් සමහර තත්කාර්යවාදී ප්‍රවනතාවෝ, මිනිසාගෙන් ස්වාධීනව පවතිමින්, ඔහුගේ ක්‍රියාකාරීත්වයට සීමාවන් පනවන වෛෂයික යථාර්ථයක් පවතී ය යන්න පිලිබඳව කථා කිරීම දාර්ශනිකව විකාර සහගත යයි ප්‍රකාශයට පත් කලහ. මේ අනුව වෛෂයිකය සහ ආත්මීයය අතර පරම වෙන්වීමක් නැතැ යි යන්නෙන් ඔව්හු (ඒවා අතර) සාපේක්ෂ වෙනසක් හෝ නැතැයි නිගමනය කලහ. (විලියම්) ජේම්ස්ගේ තත්කාර්යවාදී ආත්මීය තර්කා'වයවයන් මෙම ආන්තික රූපයෙන් එෆ්.සී.ජේ. ස්කිලර්, හෙන්රි බර්ග්සන්, ජෝර්ජස් සොරේල් සහ ගියුසෙප් ප්‍රෙසේලිනි හා ජියෝවානි පැප්පිනි යන ඉතාලියානුවන් විසින් වර්ධනය කරන ලදි. පසුව සඳහන් කරන ලද්දෝ, ඔවුන්ගේ තත්කාර්යවාදය තුල වැලඳ ගත් ආත්මීය ස්වේච්ඡාවාදයේ ආන්තික රූපයන්ගේ දේශපාලනික ෆැසිස්ට්වාදී ගම්‍යමානයන් වඩාත් විවෘතව ඉස්මතු වන හෙයින් විශේෂයෙන් ම අර්ථභාරී වෙති. පැප්පිනි ලියූ පරිදි, තත්කාර්යවාදය වනාහි

> ක්‍රියා කිරීමේ, ප්‍රතිනිර්මානයේ, ප්‍රතිවර්තනයේ, නිර්මානයේ දර්ශනවාදයකි! .. සිහින දකින තාර්කිකයන්ගේ උගුල් හා හබක් හැර වෙනත් කිසිදු තැනකට නොයන පාරවල් දිගේ අයාලේ දිව යාම් - අවසාන ය. *සත්‍යය වනාහි ප්‍රයෝජනවත් දෙයයි. ඥානනය යනු කිරීම යි.* නො සහතික වූ සත්‍යයන් ගනනාවකින්, ජීවිතයේ තානය ඉහල දැමීමට වඩාත් හොඳින් ගැලපෙන හා වඩාත් ස්ථිර වාසි ලබා දීමට ඉඩ ඇති එක තෝරා ගනු. කිසියම් දෙයක් සත්‍ය නැතිනම් එහෙත් එය සත්‍යය විය යුතු යයි අප ප්‍රාර්ථනය කරන්නමෝ නම්, අපි එය *විශ්වාස කිරීම මගින්*, එය සත්‍යය බවට පත් කරමුඃ [*On Pragmatism* තත්කාර්යවාදය පිලිබඳව, යන කෘතියේ කොර්නේලියස් ඩි වාල් විසින් උපුටා දැක්විනි. (වොඩ්ස්වර්ත් ෆිලොසොපිකල් ටොපික්ස්, 2005) 73 පිටුව මුල් කෘතියේ අවධාරනය.)]

තමා ජේම්ස්ගේ තත්කාර්යවාදය අගයකරන්නෙක් යයි ප්‍රකාශ කල මුසෝලිනී මෙසේ කියා සිටියේ ය. " *දෙන ලද මොහොතක අපගේ පෞද්ගලික* පරමාධ්‍යාසයට වඩාත්ම සම්පාත වන සමාජ පර්යාය සඳහා සටන් වැදීම, මනුෂ්‍ය ක්‍රියාකාරකම් අතර වඩාත් ම අගයැති එකක් වේ." (එම, 74 පිටුව.)

මෙහි ලා ප්‍රස්තුත ප්‍රයුක්තය වන්නේ තත්කාර්යවාදීන් අවශ්‍යයෙන් ම - ෆැසිස්ට්වාදීන් තබා - දේශපාලන ප්‍රතිගාමීන් හෝ බවට පත්වීමට නැමී සිටිනු ඇත් ද යන්න නො වේ. ඇත්ත වශයෙන් ගතහොත් විලියම් ජේම්ස් මනුෂ්‍යයන් අතර අතිශයින් ම ගුනයහපත් පුද්ගලයෙක් විය; ඔහු ඇමරිකා එක්සත් ජනපදය තුල අධිරාජ්‍ය-විරෝධී ව්‍යාපාරයේ නායකයෙක් ද වූයේ ය. එහෙත් න්‍යායික සංකල්පනයන්ට ඒවාට ම ආවේනික

වූ තර්කනයක් ද පවතින අතර සමහර තත්කාර්යවාද චින්තන ප්‍රවේනි, වෛෂයික ලෝකය පිලිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක් තුල දේශපාලන භාවිතාව පදනම් කිරීමේ මාක්ස්වාදී ප්‍රයත්නය හෙලා දැකීමේ භයානක ගම්‍යතාවන් විදහා දක්වයි. තත්කාර්යවාදී ස්වේච්ඡාවාදයට වාම

රැඩිකල්වාදී දේශපාලනයේ සන්දර්භය තුල පවා විනාශකාරී විපාක ඇති කල හැකි ය. සියලු තතු යටතේ පවත්නා දේශපාලන තත්වයට, ඊට වෛෂයයිකව නො හිමි විප්ලවවාදී විභවයක් ආරෝපනය කිරීමට ආත්මීය නිර්නය සමත්ය යන ධාරනාවාදී තක්සේරුව මත පදනම් වන දේශපාලන ආරම්භකත්වයක් කම්කරු පන්තිය විනාශකාරී ප්‍රති ප්‍රහාරයකට ගොදුරු කිරීමට හේතු වනු ඇත.

මෙම අන්තරාය, ම විසින් අවධාරනය කල යුත්තේ හුදු න්‍යායික ශක්‍යතාවයක් පමනක් නො වන බව ය. නියාම-පාලිත ඓතිහාසික හා සමාජ-ආර්ථික සන්තතීන්ගේ වෛෂයික තර්කනය නො තකා හැරියා වූ ස්වෙච්ඡාවාදී පිලිවෙත් විසින් නිර්මානය කරනු ලැබූ සමාජ හා දේශපාලන විනාශයන්ගේ නටබුන්වලින් 20 වන ශතවර්ෂයේ විප්ලවවාදී ව්‍යාපාරයන්ගේ ඉතිහාසය පිරී ඇත. පවත්නා වෛෂයික සාධක පිලිබඳ අල්ප ඥානයකින් හෝ එම සාධක නො තකා හැරීමකින් ද ආත්මීය අධ්‍යාසයේ ප්‍රතිවර්තක විප්ලවීය විභවය අතිශයීකරනයකින් ද සකසන ලද පිලිවෙත්වල විනාශකාරී විපාක පිලිබඳ ඇති තරම් ඔප්පු වීමක් ස්ටැලින් කලෙක ගෙන ගිය පිලිවෙත් (එනම් සාමුහිකකරනය, සුපිරි-කඩිනම් කාර්මික කරනය) විසින් සපයා දෙනු ලබයි. මේ අනුව ගත් කල්හි සමාජවාදය සඳහා අරගලය කම්කරු පන්තියේ මූලෝපායයන් ලෝක ධනේශ්වර පද්ධතිය පාලනය කෙරෙන නියාමයන් ද ජාත්‍යන්තර පන්ති අරගලය ද මහජන සන්තානය තුල ඒවා පිලිබිඹු වන ආකාර ද පිලිබඳ විද්‍යාත්මක අවබෝධයක පදනම මත ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහි පවතින්නේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය සාම්ප්‍රදායිකව මෙතරම් අවධාරනයක් දී ඇති ඉදිරි දර්ශනය සහ

"වෛෂයික තත්ව" පිලිබඳ අතිශයින් ම දෘඪ වූ තක්සේරුවේ අර්ථභාරය යි.[8]

මා පසු ගිය ගිම්හානයේ දී පැහැදිලි කල පරිදි, " මාක්ස්වාදය, ද්‍රව්‍යවාදී ලෝක දෘෂ්ටියක් සහ විශ්ලේෂනයේ විධික්‍රමයක් ලෙස සමාජ ආර්ථික හා දේශපාලන ක්‍රියාවලීන් පාලනය කරන නියාමයන් හෙලි කරගෙන තිබේ. මෙම නියාමයන් පිලිබඳ ඥානය මගින් සැලකියයුතු ඓතිහාසික පෙරදැකීම් සඳහා පදනම් විය හැකි නැඹුරුවීම් හා ප්‍රවනතාවන් හෙලි කරගෙන ඇත. එමගින් කම්කරු පන්තියට වාසිදායක වන ප්‍රතිඵල ජනනය කලහැකි ආකාරයක දැනුවත් මැදිහත් වීමකට ඉඩකඩ සලසයි."[9]

''වාම'' අතිවික්‍රමයන් මෙන් ම අවස්ථාවාදී-අනුගතවාදී වූ ද තත්කාර්යවාදී ක්‍රියාවාදයේ සකලාකාර රූපයන්ගෙන් මාක්ස්වාදී භාවිතාව වෙන් කර දමන්නේ හරියට ම මෙන්න මේ දෙය විසිනි. ඓතිහාසික සත්‍යය පිලිබඳ කරුනක් වශයෙන් ගත් කල්හි - පවත්නා තත්වයන් අනුව ඒ හෝ මේ දේශපාලන ස්වරූපය අත්පත් කර ගැනීමට මග පෑදිය හැකි - වෛෂයිකවාදය, හතර වන ජාත්‍යන්තරය තුල එහි ඉතා ම සංවර්ධිත ප්‍රකාශනය අත්පත් කර ගත්තේ පැබ්ලෝ සහ ඔහුගේ ඇබිත්තයන් වූ මැන්ඩෙල් හා හැන්සන්ගේ සංශෝධනවාදී න්‍යාය සහ දේශපාලනයේ දී ය. පැබ්ලෝවාදී සංශෝධනවාදය මුලුමනින් ම වියුක්ත ආකාරයකට සෝෂාකාරී වාචාලයකින් යුතුව - එම අරගලයන්හි දේශපාලන නායකත්වයන්ගේ ස්වභාවය ද ජනතාවගේ විඥාන මට්ටම ද නො තකා - තමන් ඉදිරියේ පවත්නා සියලු බාධාවන් අතුගා දමමින් බලය අල්ලා ගනු ඇති සර්ව බලධාරී විප්ලවවාදී අරගල රැල්ලක් පිලිබඳ සංකල්ප රූපයක් තම විශේෂ නිර්මානය ලෙස ඉදිරිපත් කලේ ය. ස්ලෝටර් (1961 දී මාක්ස්වාදියකුව සිටිය දී) එතරම් මැනවින් ඉදිරිපත් කල පරිදි,

> "සමාජවාදී කම්කරු පක්ෂයේ අති මූලික දුබලකම වන්නේ 'වෛෂයිකවාදය' එනම් සාවද්‍ය වෛෂයිකත්වයක්, මාක්ස්වාදී විධික්‍රමය වෙනුවට යොදා ගැනීම යි. අධිරාජ්‍යවාදය ධනවාදයේ අවසාන අවධිය ය යන සිය විශ්ලේෂනයෙන් ලෙනින් එලඹුනේ කම්කරු පන්තියේ හා එහි පක්ෂයේ සවිඥානක විප්ලවවාදී භූමිකාව තීරනාත්මකව වැදගත් වන බවට වූ නිගමනයට යි. කෙසේ වෙතත් 'වෛෂයිකවාදයේ' පාක්ෂිකයන් නිගමනය කරන්නේ 'වෛෂයික සාධකයන්ගේ' ශක්තිය කෙතරම් සුවිසල් දැයි කිවහොත්, කම්කරු පන්තියේ අරගලයේ දී මාක්ස්වාදී නායකත්වයක් පිහිටුවා ගැනීමෙන් තොරව ම කම්කරු-පන්ති විප්ලවය ජයගනු ඇතැයි ද ධනපතියන්ගේ බලය පෙරලා දමනු ඇතැයි ද කියා ය." [*Trotskyism Versus Revisionism*, (සංශෝධනවාදයට එරෙහිව ට්‍රොට්ස්කිවාදය - තුන්වන වෙලුම (ලන්ඩන් 1974. 161 පිටුව).]

පැබ්ලෝවාදීන්ට එරෙහිව ක්ලිෆ් ස්ලෝටර් විසින් මෙහි ලා නිර්වචනය කෙරෙන "වෛෂයිකවාදය", විප්ලවවාදී දේශපාලනය සමාජ-ආර්ථික ප්‍රපංචයන් පිලිබඳ නිවැරදි *මාක්ස්වාදී* විශ්ලේෂනයක් මත පදනම් කිරීමට උත්සාහ දරන්නන්ට විරුද්ධව - අවමන් - පදයක් හැටියට එය පාවිච්චි කිරීමට ඔබ දරන උත්සාහය සමග මොන ම පොදු භාවයක් වත් දරන්නේ නැත. පැබ්ලෝවාදීහු දෙවන ලෝක යුද්ධයේ ඉක්බිත්තේ ලෝක ආර්ථිකය පිලිබඳ සංයුක්ත විශ්ලේෂනයක් කිරීම ප්‍රතික්ෂේප කලෝ ය; එකල්හි එහි ඇති වූ වෙනස්කම් ජාත්‍යන්තර පන්ති අරගලයේ වර්ධනයන්ට සම්බන්ධ කිරීම ගැන කියනුම කවරේ ද? ඇත්ත වසයෙන්, ක්ලිෆ් ස්ලෝටර් සමාජවාදී කම්කරු පක්ෂයේ "වෛෂයිකවාදී" නිගමනයන් "පන්ති සම්බන්ධතාවන්ගේ පොදු ඓතිහාසික ඉදිරි දර්ශනය" තුල - යුක්ති-සාධනය කරන

ලෙස එම පක්ෂයට යලි යලිත් අභියෝග කලේ ය. සමහර අවස්ථාවල දී විප්ලවවාදී නායකත්වයක් සූදානම් කර නිර්මානය කිරීම *අනවශ්‍ය* බවට පත් කරන්නේ ලෝක තත්වය තුල කුමන "වෛෂයික සාධකයන්" ද යන්න සමාජවාදී කම්කරු පක්ෂය විසින් පෙන්නුම් කල යුතුව ඇත. (එම 162) ඔහු පැබ්ලෝවාදීන්ගේ " වෛෂයිකවාදය" ද ඔවුන් නිරතුරුව ම ක්‍රියාව ආවහනය කිරීම ද "මාක්ස්වාදී නායකත්වයක් නිර්මානය කරන තුරු විප්ලවය කල් දැමිය නොහැකි වූ ජනතාවගේ 'නො ඉවසිල්ල' පිලිබඳ ඔවුන්ගේ සෝෂාකාරී සමර්පනයන් ද අතර සම්බන්ධතාවය ඔහු සටහන් කර ගනී." (එම) පැබ්ලෝවාදී වෛෂයිකවාදයේ තවත් විලක්ෂනයක් වූයේ ඔවුන් විසින් කම්කරු පන්ති සටන්කාමයේ ඉතා ම ප්‍රාථමික රූපයන් උත්කර්ෂනය කිරීම ය; එසේ කිරීම ජනතා ව්‍යාපාරය අනිවාර්යයෙන් ම එහි විප්ලවවාදී දේශපලන කර්තව්‍යයන්ගෙන් ඉවතට යොමු කල පවත්නා නිලධාරි තාන්ත්‍රික නායකයන්ට තමන්ගේ අනුගතවීම යුක්ති සාධනය කිරීමක් විය.

අපගේ "වෛෂයිකවාදය" පිලිබඳ ඔබේ රැවටිලිකාරී හෙලා දැකීම හරියට ම අවසන් වන්නේ මෙන්න මෙතැන් හි ය. අවසාන විග්‍රහයේ දී අපගේ " වෛෂයිකවාදය" පිලිබඳ ඔබගේ විවේචනය වනාහී සමාජ-ආර්ථික තත්වයන් ද කම්කරු පන්තිය මත ට බලපාන දේශපාලන ප්‍රවනතාවයන්ගේ පන්ති ස්වභාවය ද පිලිබඳ අධ්‍යයනය හා විශ්ලේෂනය ප්‍රතික්ෂේප කිරීමකි. එසේ ම අපගේ "වර්ජකවාදය" පිලිබඳ ඔබගේ හෙලා දැකීම වෘත්තීය සමිතිවල ප්‍රතිගාමී භූමිකාව පිලිබඳ පක්ෂයේ තක්සේරුවට එල්ල කරන ලද ආවෘත ප්‍රහාරයකට වැඩි දෙයක් නො වේ. ඔබ මෙසේ කියන්නෙහි ය. "වෘත්තීය සමිතිවලට ප්‍රගතිශීලී භූමිකාවක් ඉටු කිරීම සඳහා තවදුරටත් විභවයක් ඉතුරුව නැතැ යි පක්ෂය විසින් ප්‍රමානනය කරනු ලැබ දැන් දශකයකට ද වැඩි කාලයක් ගෙවී ගොස් තිබේ, එහෙත් ඒ සම්පූර්න කාලය තුල කම්කරු පන්තියට මොන ම විකල්පයක් වත් යෝජනා කිරීමට කිසිවක් කරනු ලැබ නැත. දස ලක්ෂ ගනනක් කම්කරුවන් වෘත්තීය සමිති තුල තවමත් රැඳී සිටියත් පුවත් කලාවේදය හැරෙන්නට වෘත්තීය සමිති තුල කෙරෙන සෑම කටයුත්තක් ම බොහෝ කලකට පෙර අත හැර දමනු ලැබ තිබෙන හෙයින් වෘත්තීය සමිතිවල පරිහානියේ ගම්‍යතා ග්‍රහනය කර ගැනීම සඳහා කිසිවක් මේ අතරතුර කරනු ලැබ නැත."

සියල්ලට ප්‍රථමයෙන්, වෘත්තීය සමිති පිලිබඳ අපේ විග්‍රහය හරි ද? වැරදි ද? ඒඑෆ්එල්-සීඅයිඕ (ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රධාන වෘත්තීය සමිති සම්මේලනය-පරිවර්තක) සහ අනෙකුත් වෘත්තීය සමිති සංවිධාන ගැන කුමන හෝ විශ්ලේෂනයක් වත් සම්පාදනය කිරීමට ඔබ සමත්ව නැත. ඔබ කියන්නා වූ "ප්‍රගතිශීලී භූමිකාවක්" ඉටුකිරීමට විභවයක් එතුල පවතී යයි ඔබ විශ්වාස කරනවා ද? ඔබ එසේ විශ්වාස කරනවා යයි ඔබගේ ප්‍රහාරයෙන් කෙනෙකුට සහේතුකව, නිගමනය කිරීමට ඉඩ ඇත. එහෙත් ඔබ ඔබේ නිගමනය පදනම් කර ගන්නේ කුමක් මත ද යන්න පෙහෙලි කරනවා තබා, මෙය පැහැදිලිව කියා සිටීමට හෝ ඔබ සූදානම් නැත්තේ මන් ද? එපමනක් නොව වෘත්තීය සමිති පිලිබඳ අපගේ සප්‍රතිපත්තික ආස්ථානයේ න්‍යායික පදනම විස්තාරනය කර තිබෙන සසපයේ හා ජාත්‍යන්තර කමිටුවේ පෘථුල ලිපිලේඛන පිලිබඳ විචාරාත්මක විමර්ශනයක් කිරීමට ඔබ යත්න නො දරන්නාහු ය. අතිශයින් ම ග්‍රාම්‍ය තත්කාර්යවාදයේ ගඳගසන ආකාරයකින් ඔබ පැමිනිලි කර සිටින්නේ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට උපදෙස් පතා ලියන* කම්කරුවෙකුට "ආකෘතිකව දෙනු ලබන්නේ කම්කරු නිලධරයේ ඉතිහාසය පිලිබඳ දේශනයකි; ඔහු යෙදී සිටින අරගලය කෙසේ කර ගෙන යනවා ද යන්න පිලිබඳව නම් මොන ම ඇඟෑවුමක් හෝ ඔහු ලබන්නේ නැත." එහෙත් ස්ටයිනර් හා බ්‍රෙනර් සහෝදරවරුනි, කම්කරුවෙක් තමා ක්ෂනිකව යෙදී සිටින අරගලය කෙසේ පවත්වා ගෙන යා යුතු ද යන්න, වෘත්තීය සමිතිවල ඓතිහාසික භූමිකාව වටහාගැනීමකින් තොරව දැනගැනීමට සමත් වන්නේ කෙසේ ද? කම්කරුවන් යෙදී සිටිනා ඕනෑ ම අරගලයක් එය පැන නැංගා වූ ඓතිහාසික අත්දැකීමෙන් වෙන්කර දැමීමේ ගම්‍යයන් මොනවා ද? ස්ටැලින්වාදයට එරෙහි ට්‍රොට්ස්කිගේ අරගලයේ ඉතිහාසයෙන් කම්කරුවන් අධ්‍යාපනගත නො කොට රුසියාව තුල ප්‍රායෝගික මැදිහත්වීමක් වර්ධනය කල හැකි ද? නැත හොත් චීනයේ? එසේත් නැත හොත් නැගෙනහිර යුරෝපයේ? ධනේශ්වර ජාතිකවාදයේ ඓතිහාසික භූමිකාව සහ ට්‍රොට්ස්කිගේ නො නවතින විප්ලව න්‍යායේ අර්ථභාරය අධ්‍යයනය නො කොට මැද පෙරදිග ප්‍රදේශයේ කම්කරුවෙකුට "තමා යෙදී සිටිනා අරගලය කර ගෙන යන්නේ කෙසේ දැ" යි වටහා ගත හැකි ද? ඊශ්‍රායල් සියොන්වාදයේ උපත හා ස්වභාවය අධ්‍යයනය නො කොට යුදෙව් ජාතිකවාදයේ අගවැසිපථයෙන් එලියට යන මගක් කම්කරු පන්තියේ දියුනු කොටස් විසින් සොයා ගන්නේ කෙසේ ද? මෙම ප්‍රයුක්තිය හැකි තාක් *නිරවද්‍ය ආකාරයට ඉදිරිපත් කල හොත්, දෙන ලද ඕනෑ ම අරගලයක "ස්වභාවය" වටහා ගත හැක්කේ අවශ්‍ය ඓතිහාසික සන්දර්භය තුල තැබීම මගින් පමනි.*

කම්කරුවන් ඉතිහාසයෙන් උගන්වා ගැනීමට *ලෝසවෙඅ* දරන්නා වූ ප්‍රයත්නයන්ට එරෙහි ඔබේ ලාබ ඇනුම්පදවලින් පෙන්නුම් කෙරෙන්නේ, ඔබ අපෝහකයට කරන වාචාල වන්දනාව තිබියදී ම, කම්කරු පන්තිය ගමන් කොට ඇත්තා වූ වෛෂයික සමාජ අත්දැකීම් ආයාසකර ප්‍රත්‍යාවලෝචනයකට භාජනය කිරීම මගින් නිෂ්පන්න කර ගත් න්‍යාය කෙරේ දක්වනු ලබන නොතැකීමකි. ට්‍රොට්ස්කි එතරම් හොඳින් පැහැදිලි කල පරිදි,

"න්‍යාය විසින් මෙහෙයවනු ලැබීම වනාහි වර්තමානයේ ඒ හෝ මේ ප්‍රායෝගික ප්‍රශ්නයට හැකිතාක් සාර්ථකව මුහුනදීම උදෙසා මානව වර්ගයාගේ සකල පෙරාතු ප්‍රායෝගික අත්දැකීම් මත පදනම් වූ සාමාන්‍යකරනයන් විසින් මෙහෙයවනු ලැබීම ය. මෙසේ අපි න්‍යාය මගින් භාවිතයේ සුවිශේෂ අංශයන්ට ඉහලින් සමස්තයක් - වශයෙන් - භාවිතය දරන්නා වූ ප්‍රමුඛත්වය ම ගවේෂනය කර ගනිමු." ["Philsophical Tendencies of Bureaucratism," in *The Challenge of the Left Opposition 1928-29,* (නිලධරවාදයේ දාර්ශනික ප්‍රවනතාවෝ) වාම විපාර්ශවයේ අභියෝගය 1928-29, නිව් යෝක් 1981) 396 පිටුව.]

බ්‍රෙනර් සහෝදරය, කම්කරු පන්තියේ ගත වූ 25 වසරක ඛේදජනක අත්දැකීම් තුලින් ඔබ උපුටා ගත් දේශපාලන සාමාන්‍යකරනයන් මොනවා ද? නිලධරවාදී සංවිධානවල සාපරාධී ද්‍රෝහිත්වයේ විපාකයක් ලෙස ඇමරිකානු කම්කරු පන්තිය විඳියා වූ නිමක් නැති පරාජයන් මාලාවෙන්? එක්සත් ජනපදයේ කම්කරුවන් මුහුන දී සිටුනා කර්තව්‍යයන් පිලිබඳ ඔබේ වැටැහීමට *ජාත්‍යන්තර* කම්කරු පන්තියේ අත්දැකීම් ඔබ විසින් ඒකීකෘත කර ගෙන ඇත්තේ කුමන ආකාරයකට ද? පාලක නිලධරයන් විසින් විසුරුවා හරිනු ලැබූ, සෝවියට් සංගමයේ ද නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ ද බිඳවැටීමෙන් ඔබ උකහා ගෙන ඇත්තේ කුමන පාඩම් ද? එසේත් නැත හොත් චීනයේ "මහජන සමූහාන්ඩුව" ධනේශ්වර කාර්මික නිෂ්පාදනයේ නැතිවම බැරි ලෝක ලාභ-ශ්‍රම කේන්ද්‍රය බවට ප්‍රතිවර්තනය වීමෙන් ? එසේත් නැත හොත් බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂය කම්කරු පන්තිය සමග සකල සම්බන්ධතා බිඳ දමා ඇති දුෂ්ට දක්ෂිනාංශික ධනේශ්වර පක්ෂයක් බවට පරිවර්තනය වීමෙන්? නැත හොත්, බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති සම්මේලනය මෙම පක්ෂය සඳහා දිගට ම කරන දරදිය ඇදීමෙන්? අපට මේ ආකාර තවත් බොහෝ ප්‍රයුක්තීන් පිලිබඳව කතා කල හැකි ය, එහෙත් අපට සහේතුකව උපකල්පනය කර ගත හැකි දෙය නම් ඊට උත්තරයක් නො ලැබෙන බව ය. පසු ගිය ශත වර්ෂ කාලක සමය තුල කම්කරු පන්තියේ සාම්ප්‍රදායික දේශපාලන හා වෘත්තීය සමිති සංවිධාන සියල්ල බිඳ වැටීම දේශපාලන ඉදිරි දර්ශනය කෙරේ ද භාවිතය කෙරේ ද දරන ප්‍රතිවිපාකවලට ඔබ කිසිදු සිතුවිල්ලක් යොමු කොට නැත.

## 7. නිව් යෝර්ක් නුවර ප්‍රවාහන වර්ජනය

වියුක්ත සාමාන්‍යයන්ගේ රාජ්‍යයේ විවාද සංග්‍රාම මෙහෙයවීමට කැමැති වන ඔබ සැබෑ සිද්ධීන් සහිත මහ පොලොවට බසින එක ම අවස්ථාවේ අපගේ " වෛෂයිකවාදය" හෙලා දැකීමේ දේශපාලන අන්තර්ගතය පැහැදිලි ය. සමාජවාදී සමානතා පක්ෂය සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* විසින් වෘත්තීය සමිති නිලධරයට එරෙහිව ගෙන යනු ලබන අරගලයට ඔබ විරුද්ධ ය. නිව් යෝර්ක් නගරයේ ප්‍රවාහන කම්කරුවන්ගේ අරගලයේ දී පක්ෂයේ භූමිකාවට ඔබ එල්ල කරන දිගු ප්‍රහාරය දේශපාලන ඉදිරි දර්ශනයක් මගින් ප්‍රවාහන කම්කරුවන් සන්නද්ධ කිරීමට අප ගන්නා ප්‍රයත්නය හෙලා දැකීම අරමුනු කර ගනී. කෙසේ වෙතත්, ඔබේ ප්‍රහාරයට සවිස්තරව පිලිතුරු දීමට ප්‍රථම, මෙය කිව යුතුව ඇත. ඔබගේ සම්පූර්න ලියවිල්ල ම පුරා ඔබ සැබවින් ම සඳහන් කරන එක ම සිද්ධිය ප්‍රවාහන වැඩ වර්ජනය බව ය. ඔබ ජීවත් වන නගරයෙන් පිටස්තර එක ම සිද්ධියක් වත් සඳහන් කිරීමට ඔබට නොහැකි වී ද? ඉරාක යුද්ධයට එරෙහිව පක්ෂයේ ව්‍යායාමය පරීක්ෂා කිරීමක් නො කලේ මන් ද? නැත හොත් ප්‍රන්සයේ අර්බුදය තුල ජාත්‍යන්තර කමිටුවේ මැදිහත්වීම විමර්ශනය නො කරන්නේ මන් ද? එසේත් නැත හොත් ශ්‍රී ලංකාවේ අපගේ සහෝදරවරුන්, එරටේ ආන්ඩුව දෙමල ජනයාට එරෙහි යුද්ධය අලුත් කිරීමට දරන ප්‍රයත්නයට එරෙහිව ගෙන යන්නා වූ අරගලය ගැන ඔබ කියන්නේ කුමක් ද? ඔබට මේ කිසි දෙයක් ගැන උනන්දුවක් ඇත්තේ නැත. වෙනත් කිසිදු සිද්ධියක් පිලිබඳව සඳහන් නො කෙරෙන තතු තුල - ඉරාකයේ යුද්ධය ගැන වත් - ඔබ නිව් යෝර්ක් ප්‍රවාහන වර්ජනයට වගුරුවන අවධානය මුලුමනින් ම සමබර බවින් තොර ය. අඩු ම වසයෙන් කිව හොත් එය ප්‍රාදේශීය දෘෂ්ටියක් එලිදරව් කරයි.

සසපයේ මැදිහත්වීම ව්‍යාකූලත්වයේ හා අක්‍රියතාවයේ සම්මිශ්‍රනයක් ය යන ඔබගේ පින්තාරුවෙන් කන්ඩායම්වාදීව ප්‍රේරිතවූ වංචාවේ දුගඳ වහනය වෙයි. ඔබ සිද්ධීන් පිලිබඳව කරන පුනරාවලෝකනයේ මොන ම සංයුක්ත භාවයක් හෝ ඇත්තේ නැත; "දෙසැම්බර් මාසයේ (2005) දින තුනේ වැඩ වර්ජනය" සඳහන් කරන්නෙහි ය, එහෙත් එය සිදු වූ දින වත් නිශ්චිත ලෙස ඉදිරිපත් නො කොට ය. මෙය සුලුපටු මගහැරීමක් නො වේ. ඔබගේ විස්තරය මත රඳෙන කෙනෙකුට වෛෂයික වර්ධනයන් සසපයේ මැදිහත්වීම හා සම්බන්ධ කරනු නොහැකි ය. "මෙම වැඩ වර්ජනයට දිගු කාලීන සූදානමක් පැවැති නමුත්, මෙම වෘත්තීය සමිතිය තුල පක්ෂයට දිගු ඉතිහාසයක් තිබුනු නමුත්, වැඩ වර්ජනය ඇරඹීමට පෙර දිනය වන තෙක් ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබුවේ නැත" යි ලියන්නෙහි ය. නිශ්චිත කාල රාමුවක් ඉදිරිපත් නො කරනවා පමනක් නො ව ඔබගේ විවේචනය ප්‍රවාහන වැඩ වර්ජනය පිලිබඳව සසපය විසින් ලියන ලද එකදු වාක්‍යයක් වත් උපුටා දක්වන්නේ ද නැත. ඔබගේ ලේඛනය කිය වූ කවරෙකුට හෝ පක්ෂයේ මැදිහත්වීමේ පරිමාව පිලිබඳව හෝ එය සටන් වැදුනා වූ ක්‍රියාමාර්ගය ගැන හෝ නිශ්චිත සංකල්පයක් තනා ගැනීමට මොන ම විධියක් වත් ඇත්තේ නැත.

ප්‍රවාහන වැඩ වර්ජනයට පක්ෂයේ මැදිහත්වීම පිලිබඳ ඔබේ ප්‍රහාරයෙහි අධ්‍යාසය වන්නේ පක්ෂයේ "වෛෂයිකවාදය" සහ

"වර්ජකවාදය" පෙන්වාදීම හෙයින් සැලකිය යුතු

ආකාරයෙන් එයට පිලිතුරු දීම අවශ්‍ය වේ. දෙසැම්බර් 20 වන අඟහරුවාදා ආරම්භ වූ ස්ට්‍රයිකය දෙසැම්බර් 22 බ්‍රහස්පතින්දා අවසන් විය. ඔබගේ ලිපිය පාඨකයින්ට දෙන ඇඟැවීම නම් සසපය වර්ධනයන්ට මුහුන දුන්නේ නුසූදානම් ව බවත් ප්‍රකාශයක් නිකුත් කර ගැනීමට සමත් වූයේ ස්ට්‍රයිකය සිදුවීමට ඔන්න මෙන්න කියා තිබුනු තත්වයක් තුල බවත් ය.

දැන් අපි ප්‍රවාහන වර්ජනයට පක්ෂයේ තථ්‍ය ප්‍රතිචාරය පුනර්නිර්මානය කොට බලමු.

2005 දෙසැම්බර් 10 දින, වැඩ වර්ජනය ඇරඹීමට දස දිනකට පෙර, ඇලන් වයිට් විසින් ලියන ලද දිගු ප්‍රකාශයක් *ලෝසවෙඅ* පල කලේ ය; එම ප්‍රකාශය ප්‍රවාහන වෘත්තීය සමිතියේ 100 ලෝකලය සහ නිව් යෝර්ක් නාගරික ප්‍රවාහන අධිකාරිය (එම්ටීඒ) අතර සට්ටනය මතු කල කේන්ද්‍රීය අනුවෘත්තීන් විග්‍රහ කලේ ය. කොන්ත්‍රාත්තුව පිලිබඳ ආරාවුල පරෙස්සම් සහිතව පුනරාවලෝකනය කල වයිට් මෙසේ ලිවී යː

> කම්කරුවන් ප්‍රවාහන පද්ධතිය 11 දිනක් වසා තැබූ අන්තිම වැඩ වර්ජනයේ පටන් අවුරුදු 25 ක් ගත වී තිබේ. ඒ ශතවර්ෂ කාල ඇතුලත නිව් යෝර්ක් නගරයේ ද එක්සත් ජනපදය පුරාම ද කම්කරුවෝ තමන්ගේ ආදායම නො නවත්වා ම බාදනය වී යන සැටිත් සමග යහපත් වැටුප් සහිත රැකියා මිලියන ගනනක් කැපී යන අයුරු ද සමාජ සුබසාධන වැනසී යන අයුරු ද මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත ට ප්‍රහාරයක් එල්ල වූ අයුරු ද අත්විඳ ඇත්තාහ. මෙම ප්‍රහාර දැවැන්ත ධන සම්භාරයක් උදුරා ඉහලම ආදායම් ලබන මුදුනේ සියයට එක් දෙනාගේ බැංකු ගිනුම්වලට මාරු කරනු ලැබූ තතු තුල එමගින් සමාජ අසමානතාවයේ යෝධ වර්ධනයක් සඳහා කොන්දේසි නිර්මානය කරනු ලැබ ඇත.
>
> මෙම ප්‍රහාරයන්ට එරෙහිව සටන් වැදීමට වෘත්තීය සමිතිවලට නො හැකි බව තහවුරු වී තිබේ. ඩිමොක්‍රැටික් පක්ෂයට ද ලාභ ගරන පද්ධතියට ද යටත් වූ අවස්ථාවාදී නිලධරයක ග්‍රහනයේ පවත්නා සමිති නිමක් නැති සහන මාලාවක් (ස්වාමි පක්ෂයට) ප්‍රදානය කිරීම කම්කරුවන් ලවා පිලිගැන්වීමට සහයෝගය දී ඇත.
>
> වෝල් වීදියේ ආඥාවලට එරෙහිව නැගී සිටීමට කම්කරු පන්තියට පවත්නා බලය විදහා දක්වන ප්‍රවාහන කම්කරු අරගලයක් නිව් යෝර්ක් නගරය තුල ද රට පුරාම ද බලගතු සහායක් දිනා ගනු ඇතැ යි යන්න ගැන සැකයක් නැත. එහෙත් පසු ගිය අවුරුදු 25 තිස්සේ එල්ල වූ ප්‍රහාරවලින් ජීවන තත්වයන් ආරක්ෂා කිරීම සඳහා හුදෙක් සටන්කාමී ස්ට්‍රයික් ක්‍රියාවලට වැඩි දෙයක් අවශ්‍ය ය.
>
> අන් සියල්ලට මත් වඩා ඒ සඳහා ලාභ ගරන පද්ධතියට එරෙහිව දේශපාලන අරගලයක් සඳහා සමස්ත කම්කරු පන්තිය බලමුලුගන්වා ගැනීම අවශ්‍ය වේ. මෙහි අර්ථය නම් ඩිමොක්‍රැටික් පක්ෂයෙන් බිඳී වෙන් වී මූල්‍ය ප්‍රභුවක් විසින් ධනය ගොඩ ගසා ගැනීමට එරෙහිව මානව අවශ්‍යතා සාක්ෂාත් කර ගත හැකි වන පරිදි සමාජ ප්‍රතිසංවිධානය කිරීමට සටන් කරන ස්වාධීන දේශපාලන පක්ෂයක් ගොඩනැගීම වේ.
>
> එවන් පක්ෂයක් ම පමනකි ප්‍රවාහන පද්ධතියේ නයකර අහෝසි කර දමමින් ද නයවලින් දැවැන්ත ලාභ ගරා ගත් මහා මූල්‍ය සමාගම් හා බැංකුවල යෝධ සම්පත් පොදු අයිතියට යටත් කරමින් ද මහජන ප්‍රවාහනයට අවශ්‍ය වූ සම්පූර්න මුදල් සම්පාදනය කිරීමට සමත් වනු ඇත්තේ.

මෙම ප්‍රකාශය පත්‍රිකාවක් ලෙස පල කොට ප්‍රවාහන කම්කරුවන් අතර බෙදා හරිනු ලැබිනි. මේ අනුව වැඩ වර්ජනය අරඹීමට (එනම් ප්‍රවාහන කම්කරු සමිති නායකත්වය විසින් එය ඇරඹීම එක්වතාවක් කල් තැබුවාට පසුව) දින 10කට පෙර *ලෝසවෙඅ* ඉතා පැහැදිලි දේශපාලන-ක්‍රියාමාර්ගික ප්‍රකාශයක් නිකුත් කර තිබුනි. ඉන් දින දෙකකට පසු, දෙසැම්බර් 12 දින, *ලෝසවෙඅ* වයිට්ගේ තවත් ලිපියක් පල කලේ ය. එම ලිපිය මුලින් දෙසැම්බර් 16 දා ට නියම කෙරුනු වැඩ වර්ජනය අනුමත කල ඡන්ද විමසීම වාර්තා කලේ ය. ලිපිය වෘත්තීය සමිති නිලධාරීන්ගේ දෙපිටකාට්ටු ස්වභාවය පිලිබඳ අනතුරු හඟවමින්, වැඩ වර්ජන

රැස්වීමේ දේශපාලන වංචාකාර ජෙසී ජැක්සන් ද සිටීම මගින් වෘත්තීය සමිති (ටීඩබ්ලිව්යූ) නායකත්වය ඩිමොක්‍රැටික් පක්ෂය සමග දේශපාලනිකව බංකොලොත් සන්ධානයක එල්බී සිටින බවට අනතුරු ඇඟවිය.

දෙසැම්බර් 16 දා *ලෝසවෙඅ* බිල් වැන් ඕකන් විසින් ලියන ලද, "නිව් යෝර්ක් ප්‍රවාහන කම්කරුවන් මුහුන දී සිටින දේශපාලන ප්‍රශ්න" යන විශ්ලේෂනය පල කලේ ය. එම ලිපිය නගරාධිපති බ්ලූම්බර්ග් වෘත්තීය සමිතියට එරෙහිව දැවැන්ත නීතිමය ප්‍රහාරයක් එල්ල කිරීමට කරන සූදානම ගැන ප්‍රවාහන කම්කරුවන්ට අනතුරු ඇඟවී ය. කම්කරු පන්තියේ පුලුල් ම කොටස් *බලමුලුගන්වා ගන්නේ නැතිව සාර්ථක වැඩ වර්ජනයක්* ගෙන යාමට වෘත්තීය සමිතිය අසමත් බව එය අවධාරනය කලේ ය. එහෙත් "එවන් අරගලයක් ඉදිරියට ගෙන යාම සඳහා ටීඩබ්ලිව්යූ වේ 100 ලෝකලයේ නායකත්වය සූදානම් වන බවක් ගැන කිසිදු ඇඟවීමක් නැතැ" යි එය අවධාරනය කලේ ය, "ලෝකල් 100 සභාපති රොජර් ටුසේන්ට් විසින් මෙහෙයවනු ලබන වෘත්තීය සමිති නිලධරය, සිය ආයාචනය දැඩිව ම සීමා කර සිටින්නේ වෘත්තීය සමිති සටන්කාමයේ අවම පොදු සාධකයට ය. ඒ සමග ම එය කම්කරුවන්ගේ මිත්‍රයන් ලෙස ඩිමොක්‍රැටික් පාක්ෂික දේශපාලකයන්ට ප්‍රචාරයක් ලබා දෙයි."

පූර්න-පරිමාන වැඩ වර්ජනයක් කල් දැමීමටත් විටින් විට වර්ජන කිහිපයක් කැඳවීමටත් ටීඩබ්ලිව්යූ ව ගත් තීන්දුව දෙසැම්බර් 17දා වැන් ඕකන් වාර්තා කලේ ය.

දෙසැම්බර් 19 දා පීටර් ඩැනියල්ස් විසින් ලියන ලද "නිව් යෝර්ක් නාගරික ප්‍රවාහන කම්කරුවෝ පන්ති සට්ටනයක අද්දර" නමැති ප්‍රකාශය *ලෝසවෙඅ* පල කලේය, (එය පත්‍රිකාවක් ලෙස ද මුද්‍රනය කර බෙදා

හරින ලදී.) මෙම ප්‍රකාශය 1980 අප්‍රේල් මස දී පැවැත් වුනු නිව් යෝර්ක් ප්‍රවාහන කම්කරු වර්ජනය පාවා දීමට ද, 1981 පැට්කෝ වර්ජනය විනාශ කිරීමට ද ඉක්බිති ව ඇමරිකානු කම්කරු පන්තිය ගමන් කර තිබුනු ප්‍රමුඛ අත්දැකීම්වල පාඩම් සමාලෝචනය කලේ ය. දේශපාලන මූලෝපායක අවශ්‍යතාවය ප්‍රකාශනය විසින් අවධාරනය කරන ලදී. "මෙම අරගලය පිලිබඳ සත්‍යය මුල පටන් ම අවධාරනය කල යුතු ය. ප්‍රවාහන කම්කරුවන්ගේ අරගලය එක්කෝ වෙනත් කම්කරු කොටස්වල සහාය රැකියා හා පොදු සේවාවන් මත සියලු ප්‍රහාරයන්ට එරෙහි දේශපාලන ප්‍රතිප්‍රහාරයක් සඳහා ලබා ගත යුතු ය. නැත හොත් එය හුදෙකලා කොට පරාජයට පත් කරනු ලබනු ඇත." එය මෙසේ ද අනතුරු හැඟවිය. "මෙම අරගලය පවත්වා ගෙන යාම සඳහා ටූසෙන්ට් මත විශ්වාසය තැබීම භයානක වරදක් වනු ඇත. ලෝකල් 100 සභාපතිවරයා කම්කරුවන්ගේ ස්වාධීන අරගලයට සිය විපක්ෂ භාවයද මහා කොම්පැනිකාර ඩිමොක්‍රැටික් පක්ෂය කෙරේ සහාය ද ඉඳහිට කෙරෙන සෝෂාකාරී තර්ජනයන් සමග ඒකාබද්ධ කරයි." ප්‍රකාශය කම්කරුවන් "ස්වාධීන ස්ට්‍රයික් කමිටු සංවිධානය කර එක්සත් බව සහ අරගලය පිලිබඳ පනිවුඩය වැඩ කරන ජනතාවගේ සියලු කොටස් වෙතත් වෘත්තීය සාංගමිකයන්, අසංවිහිත කම්කරුවන්, විරැකියන්, ආගාමිකයන්, ශිෂ්‍යයන්, තරුනයන්, සවෘත්තිකයන් සහ කුඩා ව්‍යවසායකයන් අතරට ගෙන යන ලෙස" කම්කරුවන් අනවා සිටියේ ය.

ඔබ මෙයින් එකදු වාක්‍යයක් වත් උපුටා නො දක්වා කර ඇති, ඔබේ ප්‍රධාන විවේචනය වූයේ *ලෝසවෙඅ* "මෙම කමිටු කෙසේ පිහිටුවාලිය යුතු ද, ඒවා කෙසේ ක්‍රියා කල යුතු ද, අර සියල්ලටමත් වඩා ඒවා කුමක් සඳහා සටන් වැදිය යුතු ද" යනාදිය පිලිබඳ කිසිදු ඇඟැවීමක් නො කල බව ය. නැත. අප උත්සාහ කලේ වර්ජක කමිටු ගොඩනගා ගත යුත්තේ කෙසේ ද යන්න ගැන අත් පොතක් ලිවීමට නො වේ. කම්කරුවන් ටීඩබ්ලිව්යූ ලෝකල් 100 නායකත්වයට හා එහි පිලිවෙත්වලට එරෙහි විකල්පයක අවශ්‍යතාවය වටහා ගත් තාක් දුරට, ඔවුන් අනුගාමිකත්වයේ වැඩ වර්ජන කමිටු නිර්මානය කිරීම සහ පවත්වා ගෙන යාම පිලිබඳ විස්තර සකසා ගැනීමට උවමනාවටත් වඩා හොඳින් සමත් වනු ඇත. එහෙත් අප සත්තකින් ම පැහැදිලි කල දෙය නම් එවන් කමිටු සටන් කල යුතු කුමක් උදෙසා ද යන්න ය. ප්‍රකාශනය වැඩ වර්ජනයේ ඉරනම රඳා පැවැති දේශපාලන මූලෝපාය සටහන් කලේ ය. මෙම විවේචනයෙන් උපකල්පනය කර ගැනීමට සිදුවන්නේ වැඩ වර්ජනය විසින් අමතර දෛනික දුෂ්කරතාවයන් ට මුහුන දෙවුනු පලල් නිව් යෝර්ක් කම්කරු ජනතාව තුල සහයෝගය දිනා ගත හැකි ව තිබුනු එක ම මග වූ - දේශපාලන අරගලයක් ප්‍රවාහන කම්කරුවන් විසින් කිරීම අවශ්‍ය යයි *ලෝසවෙඅ* කල අවධාරනයට ඔබ එකඟ නැති බව ය.

දෙසැම්බර් 21 දින *ලෝසවෙඅ* පල වූ නව ප්‍රකාශයක් විය. (එය ද මුද්‍රනය කොට නගරය පුරාම පලල්ව බෙදා හරින ලදී.)

"නිව් යෝර්ක් ප්‍රවාහන වර්ජනයඃ පන්ති අරගලයේ නව අවධියක්." නම් එම ප්‍රකාශය ඇමරිකා එක්සත් ජනපදය තුල සමාජ ධ්‍රැවීකරනයේ සන්දර්භය තුල අරගලයේ ගම්‍යයන් පරීක්ෂාවට බඳුන් කරමින් නගරාධිපති බ්ලූම්බර්ග් ප්‍රවාහන කම්කරුවන් ට එරෙහිව මෙහෙය වූ මුර්ග නීතිමය ප්‍රහාරයට පාදක වූ මූල්‍යමය අවශ්‍යතාධාරීන් එලිදරව් කලේ ය. එය වැඩ වර්ජනය නීති විරෝධී යයි හෙලා දැක වර්ජකයන් වහාම ආපසු වැඩට යා යුතු යයි ප්‍රකාශ කල ටීඩබ්ලිව්යූ වේ ජාත්‍යන්තර නායකත්වය ඉටු කල ද්‍රෝහී භූමිකාව එලිදරව් කොට දේශපාලන අනුවෘත්තීන් පිලිබඳ සාරාංශයක් සමග සමාප්ත වියඃ

> "පසු ගිය දශක දෙක තුල වෙන මොනයම්මැ සිද්ධියකට ද වඩා, නිව් යෝර්ක් නාගරික ප්‍රවාහන කම්කරුවන්ගේ වර්තමාන වැඩ වර්ජනය මුලු මහත් කම්කරු පන්තිය ඉදිරියේ ම තබන්නේ මූල්‍ය ප්‍රභුවේ ලාභ පසුපස දිවීමට එරෙහි ව වැඩ කරන ජනයාගේ උවමනාකම් හා අවශ්‍යතාවයන් ආරක්ෂා කිරීම සඳහා අරගලය ඉදිරියට ගෙන යාමට නව නායකත්වයක් ද නව දේශපාලන මූලෝපායයක් ද වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාවය යි"
>
> "මෙම වැඩ වර්ජනය සාර්ථක වීමට නම්, ප්‍රවාහක කම්කරුවන් මූල්‍ය කතිපයාධිකාරයේ හා එහි දේශපාලන පක්ෂයන්හි සමාජ, ආර්ථික සහ දේශපාලන උපකල්පනයන් ප්‍රතික්ෂේප කරන්නා වූ ඉදිරි දර්ශනයක් විසින් මෙහෙයවීගත යුතු ය. කම්කරුවන්ගේ ජීවන තත්වයන් කප්පාදු කිරීම සඳහා කෙරෙන්නා වූ නිමක් නැති බලපෑම පැහැදිලිව ම විදහා දක්වන්නේ වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවයන් ධනේශ්වර ලාභ ගරන පද්ධතියේ අවශ්‍යතා සමග නො පෑහෙන බව ය."

මෙම ප්‍රකාශයට අමතර ව දෙසැම්බර් 21 දා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වැඩ වර්ජක කම්කරුවන් සමග සම්මුඛ සාකච්ඡා ගනනාවක් ද පල කලේ ය.

දෙසැම්බර් 22 දා *ලෝසවෙඅ* "නිව් යෝර්ක් ප්‍රවාහන කම්කරුවෝ උග්‍රවන ප්‍රහාරයන්ට මුහුන දී සිටිති" යන තවත් ප්‍රධාන ප්‍රකාශයක් පල කලේ ය. (මෙය ද මුද්‍රනය කොට පලල්ව බෙදා හරින ලදී.) නගරාධිපති බ්ලූම්බර්ග් සහ ආන්ඩුකාර පටාකි ගේ දේශපාලන මූලෝපාය සමාලෝචනය කල එය වැඩ වර්ජනය කෙරේ ඔවුන් දැක් වූ නිර්දය ප්‍රතිචාරයට හේතු පෙන්නුම් කලේ ය. පාලක ප්‍රභුව වැඩ වර්ජනය පරාජයට පත් කල යුතු වූ ප්‍රධාන අභියෝගයක් ලෙස සැලකුවේ මන්දැයි යන්න ද එය විසින් පැහැදිලි කරන ලදී. වැඩ වර්ජනය හුදෙකලා කොට කඩාකප්පල් කිරීමට ලේබර් නිලධරය දැරූ ප්‍රයත්නය ද පාලක පන්තිය තුල වර්ජනයට වැඩුනු පන්ති ඒකාබද්ධතාවය ද ප්‍රතිසන්දනය කල *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, කම්කරුවන් "

තමන්ගේ ම ස්වාධීන වැඩ වර්ජන කමිටු සංවිධානය කොට සහයෝගය බලමුලුගැන්වීම සඳහා කම්කරු පන්තියේ පලල් ම කොටස් දෙසට හැරී ගත යුතු ය" යි යලිත් කියා සිටියේ ය.

මේ සමග ම *ලෝසවෙඅ* වර්ජක කම්කරුවන් සමග තවත් සම්මුඛ සාකච්ඡා ද ඉදිරිපත් කලේ ය.

දෙසැම්බර් 23 දා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වැඩ වර්ජනයේ හදිසි අවසානය පිලිබඳ "ප්‍රාථමික ඇගැයීමක්" ඉදිරිපත් කලේ ය. එය වෘත්තීය සමිති නායකත්වය විසින් තනි කර දමන ලද වැඩ වර්ජනයේ ප්‍රතිඵලය පිලිබඳ ඍජු හා බැරෑරුම් තක්සේරුවක් විය. ටුසේන්ට් "වැඩ වර්ජනය පවත්වා ගෙන ගියේ හුදු සරල වෘත්තීය සමිති අරගලයක් ලෙස ය. ඔහු එසේ කලේ ටේලර් පනත සහ උසාවිය මගින් රාජ්‍යයේ මුලු බලය ප්‍රවාහන කම්කරුවන්ට එරෙහිව මෙහෙයවන තත්වයක් තුලය" යි එය පෙන්වා දුනි. මෙම අත්දැකීමේ වඩා පුලුල් පාඩම් අධ්‍යයනය කල *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කම්කරු පන්තිය සමාජ බලයක් හැටියට අහෝසි වී ඇතැ යි කියා පෑ සියල්ලන් ම එය විසින් නිෂ්ප්‍රභ කරනලද බව පෙන්වා දුනි. මුලු ප්‍රවාහන පද්ධතිය ම වසා දැමීමේ දී කම්කරු පන්තිය විදහා දැක්වූයේ තමන්ගේ යෝධ සමාජ භාරය ද සටන්කාරීත්වය ද වේ. එසේ ම අරගලය එලිදරව් කලේ පවත්නා වෘත්තීය සමිති සමාජ අරගලයේ උපකරන ලෙස අපේක්ෂා නාශක බවය, නො පොහොනා බව ය. ඒ තාක් දුරට මෙම සංවිධානයෝ - ටීඩබ්ලිව්යූ ජාත්‍යන්තරය පමනක් නො ව සමස්තයක් වශයෙන් ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධානය ද මෙන් - කෙලින් ම කම්කරු පන්තිය පාගා දැමීමේ නිරතව නො සිටින්නාහු නම්, අඩුගනනේ ඔවුන්ට විකල්ප දේශපාලන, සමාජ සහ ආර්ථික ඉදිරි දර්ශනයක් හා වැඩ පිලිවෙලක් නැති හෙයින් රාජ්‍යයේ ප්‍රහාරයන් ඉදිරියේ අනාරක්ෂිත තත්වයකට පත්ව සිටිති. ඩිමොක්‍රැටික් පක්ෂය හා බැඳුනු දේශපාලන වසයෙන් ප්‍රතිගාමී නිලධරයක් විසින් අධිගෘහිත වූ මෙම සංවිධානයෝ පාලක ප්‍රභූවේ ඉල්ලීම් කම්කරු පන්තිය මත පැටැවීමේ මාධ්‍ය බවට අනිවාර්යයෙන් ම ප්‍රතිවර්තනය වී සිටින්නාහ." " කම්කරු පන්තිය අශමනීය ප්‍රති-ධනේශ්වර පිලිවෙතක පදනමේ ඒකාබද්ධ කිරීමට සමත් නව සමාජවාදී ව්‍යාපාරයක්" ගොඩනැගිය යුතු යයි *ලෝසවෙඅ* කැඳවා සිටියේ ය.

දෙසැම්බර් 24 දින වෘත්තීය සමිති විසින් ලෝකල් 100 වැඩ වර්ජනය කඩාකප්පල් කරනු ලැබූ සැටි පිලිබඳ විස්තර සම්පාදනය කල *ලෝසවෙඅ* පල වූ තවත් ප්‍රමුඛ ප්‍රකාශනයක් මුද්‍රනය කොට බෙදා හරින ලදී.

ප්‍රවාහන වැඩ වර්ජනයේ දී පක්ෂයේ මැදිහත්වීම පිලිබඳ ඔබගේ ප්‍රහාරය සාරවත් බවින් තොර ය. ඔබ මෙහි දී පදනම් වන්නේ ඔබගේ පාඨකයන්ට (අපගේ මැදිහත්වීම පිලිබඳ) ලිඛිත වාර්තාවට අතගසා ගැනීමට නො ලැබෙනු ඇතැ යි යන උපකල්පනය මත ය. කෙසේ වෙතත් ප්‍රවාහන කම්කරුවන්ගේ අරගලයට *ලෝසවෙඅ* ප්‍රතිචාරය සමාලෝචනය කරනවා නම් අපට දැකගත හැකි වන්නේ දෙසැම්බර් 10 හා දෙසැම්බර් 24 අතරතුර දෙසතිය ඇතුලත එය ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රකාශයන් හයක් ද තවත් ලිපි අටක් ද පලකල බව ය. ලිපි අට එක්කෝ සවිස්තර ප්‍රවෘත්ති වාර්තා ය, ප්‍රවාහන කම්කරුවන් සමග සම්මුඛ සාකච්ඡා ය, එසේ නැතහොත් නිව් යෝර්ක් නගරයේ සමාජ බෙදීම පිලිබඳ ප්‍රශ්නයන්ට අදාල අර්ථකථනයන් ය. මෙම ලිපි 14න් අටක් ම මුද්‍රනය කොට බෙදාහරින ලදි.[10] සසපයේ වර්ජකවාදය ඉහලින් ම ප්‍රකාශයට පත් කරන්නේ ය යි කියනු ලබන (සිද්ධිය පිලිබඳ) වාර්තාව එය යි! ප්‍රවාහන කම්කරු වර්ජනයට දක්වන ලද මෙම ප්‍රතිචාරය කම්කරු පන්තියේ අරගල තුල නව දේශපාලන මූලෝපායක් වර්ධනය කිරීමේ අරගලය තුල දී *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* විසින් ඉටු කරනු ලබන තීරක භූමිකාව විදහා දැක්වී ය. එසේ ම සලකුනු කර ගත යුතු කරුනක් නම් මෙම සමස්ත කාල පරිච්ඡේදය තුල ම, අදාල වෘත්තීය සමිතිය ම ගත හොත් දිගින් දිගට ගිය අරගලය පිලිබඳ දෛනික විශ්ලේෂනයක් පසෙක තිබියේවා, පලල්ව බෙදා හැරීම සඳහා අඩු ගනනේ එක ද ප්‍රකාශනයක් වත් පල නො කල බව ය. නිලධරයේ කඩාකප්පල්කාරීත්වය තනි අතින් ජය ගැනීමට *ලෝසවෙඅ* ට නො හැකි වූ බව සැබැවි. කෙසේ වෙතත් එය කම්කරුවන්ගේ පන්ති විඥානය ඔසොවාලීමට අර්ථභාරී ප්‍රතිපදානයක් කල අතර අනාගත ජයග්‍රහන සඳහා පදනමක් ද දැමී ය.

මෙම අරගලයට ස්ටයිනර් සහෝදරයා කල ප්‍රායෝගික ප්‍රතිපදානය පිලිබඳ සවිස්තර වාර්තාවක් දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටීමට තරම් මම නිරාචාරශීලී නො වන්නෙමි; එහෙත් ස්ට්‍රයිකය තුල දී ඔබගේ ප්‍රායෝගික කටයුතු වූයේ කුමක් දැයි අපට කීමට ඔබ අසමත්ව සිටින බව නම් ටිකක් පැහැදිලි ය. ඔබ මොනවා ද කලේ? ඔබ මොනවා ද ලියුවේ? ප්‍රකාශයක් කෙටුම්පත් කලා ද? - සමහර විට "ප්‍රවාහක වර්ජනය සහ යුතෝපියාව (මනෝරාජ්‍යය) යන මැයෙන්? සමහර විට ඒ හෝ මේ දුෂ්කරතාවන් වැඩ වර්ජනයට කෙලින් ම මැදිහත්වීමෙන් ඔබව වලක්වා ලන්නට ඇත. එසේ නම්, සමාව ඉල්ලීමට අවශ්‍යතාවයක් නැත. එහෙත් යුතෝපියානුවාදය ක්‍රියාවේ දී අත්පත් කර ගන්නා ස්වරූපය පිලිබඳව, ඔබගේ විවේචනයේ ඔබට ඇරුනු ඉඩකඩ, අඩු වසයෙන් න්‍යායිකව පැහැදිලි කිරීමට ඔබ අවස්ථාව නොගැනීම අපේක්ෂාභංගකර ය. ඔබගේ යුතෝපියානු වැඩ සැලසුම් තිබෙන්නේ ප්‍රධාන වසයෙන් ම සුලු-ධනේශ්වර රැඩිකල් කවයන් තුල සාකච්ඡා කිරීමට යයි නිගමනය කිරීමට අපට අයිතියක් ඇත. එහෙත් කම්කරුවන් අතර නම් බෙදා දීමට ඔබට තිබෙන්නේ වෘත්තීය සමිතිවාදයේ දියාරු සාම්බාරුව ය.

## මතු සම්බන්ධයි

# සටහන්

4. අපෝහක දර්ශනවාදය පිලිබඳ ඉතාමත්ම මෑත දී ලියන ලද ලිපිය නම් *Marx after Marxism* (මාක්ස්ගෙන් පසු මාක්ස්වාදය) යන මහාචාර්ය ටොම් රොක්මෝර්ගේ ලේඛනය පිලිබඳ මගේ ම සවිස්තර විවේචනයයි. (බලන්න. ''හෙගල්, මාක්ස්, එංගල්ස් සහ මාක්ස්වාදයේ සමාරම්භයෝ'' http://wsws.org/articles/2006may2006/rock-m02.shtml] ඔබ ඔබගේ ලිපිය අපට එවීමට සති දෙකකට පමන පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ මැයි 02-03 කලාපවල පල කරන ලදි. ඔබ ම පමනක් මැනවින් දන්නා හේතු මත ඔබ එය නො තකා හැරීමට තීන්දු කලාහු ය.

5. ජාත්‍යන්තර කමිටුව අපෝහක විධික්‍රමය ගැන නිකම්ම කතාකරනවා නො වේ. එය දේශපාලන විශ්ලේෂනයේ උපකරනයක් ලෙස අපෝහක විධික්‍රමය යෙදීමේ ප්‍රයත්නයක නිමග්නව පවතී. උදාහරනයක් හැටියට 1998 ඕස්ට්‍රේලියාවේ දී වෘත්තීය සමිතිවාදයේ ස්වභාවය පිලිබඳව කල දේශනයක දී, මෙම සංකීර්න සමාජ ආකෘතියේ ස්වභාවය පිලිබඳව අපෝහක තර්ක ක්‍රමය එලියක් විහිදුවන්නේ කෙසේ ද යන්න විදහා දැක්වීමට උත්සාහ කලෙමි.

"වෘත්තීය සමිතිවාදය හැදෑරීම සඳහා යෙදී ගන්නා විට, අප පොරබදනුයේ නිශ්චිත සමාජ රූපයක් සමග බව සිතේ තබා ගත යුතුව ඇත. මෙයින් අදහස් කරනුයේ යම් ආගන්තුක, අක්‍රමවත් හා නිසි නැඹුරුවක් නැති වර්ගයේ පුද්ගල එකතුවක් නොව; යම් නිශ්චිත, විශේෂ නිෂ්පාදන සබඳතා තුල මුල් බැස ගත් හා පන්ති තුල සංවිධිත මහජනයා අතර ඓතිහාසිකව විකාශනය වූ සබඳතාවයකි. රූපයේ ස්වභාවය ගැන ම කල්පනා කිරීම වැදගත් ය. රූපය හා අන්තර්ගතය අතර පවතින සම්බන්ධකම අප හැම දන්නා නමුත් එය සාමාන්‍යයෙන් සංකල්පනය කෙරෙන්නේ, රූපය වූකලි අන්තර්ගතයේ හුදු ප්‍රකාශනයක් ය යන අන්දමිනි. එම ආස්ථානයේ සිට නම් සමාජ රූපය සංකල්පනය කෙරෙන්නේ එය පදනම් වී ඇති සබඳතාවන්ගෙන් වියෝ වූ නැමෙනසුලු හා අපරිමිතව හැඩ ගස්වා ගත හැකි ප්‍රකාශනයක් ලෙස ය. නමුත් සමාජ රූපයන් පිලිබඳ වඩාත් ප්‍රගාඪ අවබෝධයක් විසින් පෙන්නුම් කෙරෙන්නේ ඒවා ඓතිහාසික සන්තතියේ ගතික මූලාංගයන් වසයෙනි. "අන්තර්ගතය වනාහි රූපය යි" යනුවෙන් පවසන විට ඉන් අදහස් කරනුයේ, රූපය නිශ්චිත ගුනාංගයෙන් හා ගති ස්වභාවයන් ප්‍රකාශිත කරමින් අන්තර්ගතය කෙරෙහි දායක වන බවය. අන්තර්ගතය පවතින්නේ හා වර්ධනය වන්නේ රූපය තුලිනි.

"සමහරවිට, දාර්ශනික ප්‍රවර්ගයන්ගේ සහ වියුක්තකරනයන්ගේ චක්‍රය තුල ම යන මෙම වක්‍ර ගමනේ අරමුන පැහැදිලි කර ගැනීමට මාක්ස් මෙය විමසන්නාවූ, (ප්‍රාග්ධනය) *Capital* පලමු වෙලුමේ පලමු පරිච්ඡේදයේ සුප්‍රසිද්ධ කොටස පරිශීලනය කිරීම මගින් හැකි වනු ඇත: "එවිට ශ්‍රම නිෂ්පාදිතය වෙලඳ භාන්ඩයේ රූපය ආරෝපනය කර ගැනීමත් සමග ම එහි ගූඪාර්ථවත්භාවය නැගී එන්නේ ද පැහැදිලි ලෙස ම එම රූපය වෙතිනි." එනම් ශ්‍රමයේ නිෂ්පාදිතය වෙලඳ භාන්ඩයේ රූපය ආරෝපනය කර ගන්නා - සමාජයේ නිශ්චිත අදියරක දී පමනක් සිදුවන පරිවර්තනයක් වන - විට එය කලින් අයත් කර නොගෙන සිටි සුවිශේෂ සුරුවම් ස්වභාවයක් අත්පත් කර ගනී. නිෂ්පාදිතයන් වෙලඳපොලේ හුවමාරු වූ වහා ම වෙලඳ භාන්ඩයන්මත් පැන නංවන්නා වූ මිනිසුන් අතර සැබෑ සමාජ සබඳතාවෝ, අවශ්‍යයෙන් ම දේවල් අතර සබඳතාවක, පෙනුම ගනිති. ශ්‍රමයේ නිෂ්පාදිතයක් යනු ශ්‍රමයේ නිෂ්පාදිතයකි; එහෙත් එය නව නිෂ්පාදන සබඳතාවන්ගේ රාමුව තුල භාන්ඩයක රූපය ගැනීමත් සමග ම එය නව හා අසාමාන්‍ය සමාජ ලක්ෂනයක් අත්පත් කර ගනී.

"මෙසේ ම කම්කරුවන්ගේ කන්ඩායමක් යනු කම්කරුවන්ගේ කන්ඩායමකි. එහෙත් මේ කන්ඩායම වෘත්තීය සමිතියක රූපය ගත් විට එය මේ රූපය හරහා කම්කරුවන් අනිවාර්ය ලෙස ම යටත් කර තබා ගැනීම පිනිස නව හා මුලුමනින්ම විද්‍යාසමානවූ සමාජ ලක්ෂන අත්පත් කර ගනී. මෙය මගින් නිශ්චිතව ම අදහස් කෙරෙන්නේ කුමක් ද? වෘත්තීය සමිති, කම්කරු පන්තිය නියෝජනය කරන්නේ ඉතා පැහැදිලි සමාජ ආර්ථික භූමිකාවක නිරතයන් ලෙස ය. එනම් වෙලඳ භාන්ඩයක, ශ්‍රම ශක්තියේ විකුනුම්කරුවකු ලෙස ය. ධනවාදී නිෂ්පාදන සබඳතා සහ දේපල රූපාකාරයක් මත නැගී සිටින්නාවූ, වෘත්තීය සමිතිවල සාරභූත අභිප්‍රාය වන්නේ, පවත්නා වෙලඳපොල කොන්දේසි යටතේ, මෙම වෙලඳ භාන්ඩය සඳහා ලබා ගත හැකි හොඳ ම මිල රැක දීමයි.

"සත්තකින්ම වෘත්තීය සමිතිවල "සාරභූත අභිප්‍රාය" ලෙස න්‍යායික වසයෙන් මා විස්තර කර ඇති දෙය, සහ ඒවායේ යථා ජීවන ක්‍රියාකාරකම් අතර විශාල වෙනසක් තිබේ. ප්‍රායෝගික යථාර්තය - කම්කරු පන්තියේ ඉතාමත් හදිසි අවශ්‍යතාවන් දිනපතා පාවාදෙනු ලැබීම - න්‍යායිකව සංකල්පිත "නියාමයට" අනුරූප වනුයේ ඉතා මඳ වසයෙනි. එය මේ න්‍යායික සංකල්පනා සමග සමාන නොවන නමුදු එය ම වෘත්තීය සමිතිවල වෛෂයික සමාජ ආර්ථික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලය වේ. ධනවාදී නිෂ්පාදන සබඳතාවන්ගේ පදනම මත සිටගනිමින්, පන්ති අරගලය කෙරෙහි සාරභූත ලෙස ම සතුරු ආකල්පයක් ගැනීමට ඒවායේ ම ස්වභාවය විසින් වෘත්තීය සමිතිවලට බල කරනු ලැබ ඇත. ශ්‍රම ශක්තියේ මිල නියම කිරීම සහ කම්කරුවන්ගේ අතිරික්ත වටිනාකම මිරිකා ගත හැකි පොදු කොන්දේසි නිර්නය කිරීමේ දී හාම්පුතුන් සමග ඇති කරගත් ගිවිසුම් ආරක්ෂා කිරීමේ දිශාවට සිය ප්‍රයත්නයන් යොමු කරමින්, ගිවිසගත් කොන්ත්‍රාත්වල නියමයන්ට අනුකූල වන ආකාරයට සිය සාමාජිකයන්ගේ ශ්‍රම ශක්තිය සැපයීමට වෘත්තීය සමිතිවලට බල කෙරේ. ග්‍රාම්ස්කි සඳහන් කල පරිදි 'සමිතිය නීත්‍යානුකූලභාවය නියෝජනය කරන අතර, එහි සාමාජිකයන් ලවා එම නිත්‍යානුකූලභාවයට ගරු කරවීමට අරමුනු කර ගනී.'

"නීත්‍යානුකූල භාවය ආරක්ෂා කිරීම යනුවෙන් අදහස් කරනුයේ පන්ති අරගලය යටපත් කිරීම හෙවත්, ස්වභාවයෙන්ම වෘත්තීය සමිති ඒවා නිල වසයෙන් කැපවී සිටින සීමිත අරමුනු පවා සාක්ෂාත් කර ගැනීමට තමන්ට (ශ්‍රම ශක්තිය) ඇති හැකියාවට යටින් වල කපා ගන්නා බව ය. වෘත්තීය සමිතිවාදය එරී සිටින පරස්පර විරෝධය රඳා පවතින්නේ මෙහි ය." [*Marxism and the Trade Unions* (මාක්ස්වාදය සහ වෘත්තීය සමිති)]

6. පාසලේ න්‍යායපත්‍රය මෙසේ විය: දේශනය 1: රුසියානු විප්ලවය සහ 20 වන ශතවර්ෂයේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු (ඩේවිඩ් නෝර්ත්); දේශනය 2: 20 වන ශතවර්ෂයේ මුල විට සහ සංශෝධනවාදයට එරෙහිව මාක්ස්වාදය (ඩේවිඩ් නෝර්ත්); දේශනය 3: බොල්ශෙවික්වාදයේ සම්භවය සහ කලයුත්තේ කුමක් ද? (ඩේවිඩ් නෝර්ත්); දේශනය 4: මාක්ස්වාදය ඉතිහාසය සහ ඉදිරිදර්ශනයේ විද්‍යාව (ඩේවිඩ් නෝර්ත්); දේශනය 5: පලමුවන ලෝක යුද්ධය සහ ධනවාදයේ බිඳ වැටීම (නික් බීම්ස්); දේශනය 6: තනි රටේ සමාජවාදය ද නොනවතින විප්ලවය ද (බිල්වෑන් ඕකන්); දේශනය 7: මාක්ස්වාදය, කලාව සහ 'නිර්ධන පන්ති සංස්කෘතිය' පිලිබඳ සෝවියට් විවාදය (ඩේවිඩ් වොල්ෂ්); දේශනය 8: 1920 ගනන් අවපාතය හා ෆැසිස්ට්වාදය කරා මාවත (නික් බීම්ස්); දේශනය 9: ජර්මනියේ ෆැසිස්ට්වාදයේ නැගීම සහ කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ බිඳ වැටීම.

7. ලෙනින් වෛෂයික යථාර්ථය ඥානනය කිරීමට දුන් ඉමහත් වැදගත්කම ඔහුගේ *භෞතිකවාදය සහ අනුභූති-විචාරය* නම් කෘතියේ මෙසේ පැහැදිලිව ප්‍රකාශයට පත් කර ඇත:

"ඔබ ජීවත් වන බවත්, ඔබගේ ජීවනෝපාය පවත්වා ගෙන යන බවත්, දරුවන් ලබන බවත්, නිෂ්පාදිතයන් නිෂ්පාදනය කරන බවත්, ඒවා හුවමාරු කරගන්නා බවත්, වෛෂයිකව අවශ්‍ය වර්ධන දාමයක් පැන නංවයි. මෙය ඔබගේ සමාජ විඥානයෙන් ස්වාධීන වන අතර, එය (සමාජ විඥානය විසින්) කවර කලෙකවත් මුලුමනින් ම ග්‍රහනය කර ගනු නොලැබේ. මානව වර්ගයාගේ ඉහල ම කර්තව්‍යය වන්නේ ආර්ථික වර්ධනයේ මෙම වෛෂයික තර්කනය (සමාජ ජීවිතයේ විකාශනය) එහි පොදු හා අති මූලික විලක්ෂනයන්ගෙන් යුක්තව, තමන්ගේ සමාජ විඥානය ද සියලුම ධනේශ්වර රටවල දියුනු පන්තීන්ගේ සමාජ විඥානය ද හැකිතාක් නිශ්චිත, පැහැදිලි සහ විචාරාත්මක ආකාරයකට ඊට අනුකූලව හැඩ ගස්සා ගැනීම ය. (*සංගෘහිත කෘති*, 14 වන වෙලුම (මොස්කව් 1977, 325 පි. අවධාරනය මුල් කෘතියේ)

8. දේශපාලන විශ්ලේෂනය කෙරෙහි ඔබ දක්වන නොතැකීම පිලිබඳ විශේෂයෙන් ම අප්‍රසන්න වූ එක් ප්‍රකාශයක් නම් ඔබ ඔබගේ යුතෝපියානු වීරයන්ගේ දරුනුම වැරදි ඉවසා සිටීමට දක්වන කැමැත්ත ය. බ්‍රෙනර් සහෝදරය, ස්ටීව් ලෝං සහෝදරයා, (ඔබගේ ආදරනීය යුතෝපියාවේ (මනෝරාජ්‍යයේ) අවසානයේ කර්තෘ වන) ජැකොබ් තම ලේඛනය ඉදිරිපත් කරන්නේ ලිබරල්වාදය යලි පනගැන්වීමේ පක්ෂවාදියෙකු ලෙසයයි ඔබට පෙන්වා දෙන විට දෙඋර සලා ඔබ පිලිතුරු දුන්නේ, "ඉන් අදහස් වන්නේ, රැඩිකල් ලිබරල්වාද විශේෂයක් යලි පනගැන්වීම තමාගේ අධ්‍යාසය යි ප්‍රකාශ කරන ඔහුගේ කෘතියේ 8 වන පිටුවට පසුව ලියා ඇති සෑම දෙයක් ම නොතකා හැරීමට මාක්ස්වාදීන් වන අපට අයිතියක් තිබේ ය යන්නද?" යි කියමිනි. හර්බට් මාර්කියුස්ගේ සහ තියඩෝර් ඇඩොර්නෝගේ අම්හිරි දේශපාලන අතීතය ගැන ලෝංග් සහෝදරයාගේ සඳහනට ප්‍රතිචාර දක්වමින් ඔබ මෙසේ පිලිතුරු දුන්නෙහි ය: "ඔවු, ඇඩෝර්නෝ සහ මාර්කියුස් යන දෙදෙනා ම 1930 ගනන්වල ෆැසිස්ට්වාදයට එරෙහි 'එක්සත් පෙරමුනක්' නාමයෙන් මොස්කව් නඩු විභාගවලට සහාය දුන් දේශපාලන අවස්ථාවාදියෝ ය. ඉතින් ඉන් අදහස් වන්නේ ඉන් පසුව, ඔවුන්ට අපට කීමට අදාල කිසිම දෙයක් තිබුනේ නැතිය යන්න ද?" මෙම පුද්ගලයන්ගේ දේශපාලන ඌරු බව (පැරනි බොල්ශෙවිකයන් මරා දැමීම උද්වේගයෙන් වැලඳගත් අර්නස්ට් බ්ලොක් මීට ඇතුලත් කිරීමට අපි අමතක නොකරමු.") ඔවුන්ගේ යුතෝපියානුවාදය සමග බැඳී තිබුනු බව ඔබට සිතීවත් නැත්ද? යථාර්ථය පිලිබඳ වෛෂයික තක්සේරුවක් කිරීමට අසමත් වූවා පමනක් නොව ස්ටැලින්වාදී පන්නයේ විෂ සහගත බොරුවලින් ඇත්ත වෙන් කර ගැනීමටත් නො හැකි වූ පුද්ගලයන්ගේ යුතෝපියානු සංකල්ප පිලිබඳ විශ්වාසයක් අප විසින් ඇතිකරගත යුත්තේ මන් ද? ඔවුන් දේශපාලන ප්‍රයුක්තීන් සලකා බැලීමේ දී යොදාගත්තේ කුමන විධික්‍රමයක්ද යන්න ඇසීම අනාචාරශීලී ද? එසේත් නැතහොත් ඔවුන්ගේ සුධීභාවය, අනාගතය පිලිබඳව පමනක් සාර්ථක වන්නා වූ විරල හා අති විශේෂ වර්ගයක එකක් වූයේ ද!

9. මෙය සතර වන දේශනයෙන් කොටසකි. ඉන් සැලකිය යුතු කොටසක් යොදවන ලද්දේ කාර්ල් පොපර් මාක්ස්වාදයට එරෙහිව කල ප්‍රහාරයට පිලිතුරු සැපයීමට ය. ඔබගේ ලිපිය මෙම දේශනය හෝ එතුල කාර්ල් පොපර්ගේ අනුභූතිවාදයට එල්ල කල ප්‍රහාරය හෝ ගැන කිසිම සඳහනක් කරන්නේ නැත.

10. මෙම කාල පරිච්ඡේදය තුල ලෝසවෙඅ වෙනත් ප්‍රධාන ජාතික හා ජාත්‍යන්තර සිද්ධීන් පිලිබඳව දැඩි අනාවරන නොකඩවා ඉදිරියට ගෙන ගියේ ය.

© www.wsws.org